# යශෝරාවය

**ත්‍රෛමාසික පුවත්පත**

**විදුහලේ දැක්ම**

අභියෝග හමුවේ
නොසැලෙන
ගුණ නැණින් සුපෝෂිත
අභිමානවත්
දිරිය දියණියන්

හතර වන කාණ්ඩය පළමු කලාපය - 2019 මැයි, ජූනි, ජූලි

මිල රු. 25/=



දුරකථනය:- 033 2222746 ෆැක්ස්:- 033 2222746 ඊමේල්:- gmydbv@gampahait.sch.lk වෙබ් අඩවිය:- www.yasodaradevibalika.edu.lk


# ශිල්ප සුගන්ධාවලී විෂය බාහිර ඇගයීම් උලෙළ



2018 ශිල්ප සුගන්ධාවලී විෂය බාහිර ඇගයීම් උලෙළ 2019 ජූලි මස 17 වන බදාදා දින බස්නාහිර පළාත් අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් එස්.පී. විජයබන්ධු මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. සමස්තලංකා මට්ටමේ ජයග්‍රහණ ලබාගත් ගායන, වාදන, නර්තන අංගයන්ගෙන් උලෙළ වර්ණවත් විය. බහුවිධ බුද්ධීන් කිහිපයක් ඔස්සේ විශිෂ්ට දක්ෂතා පෙන්වූ ශිෂ්‍යාවන් ඇගයීම උදෙසා පවත්වනු ලබන මෙම උලෙලේ දී වසරේ හොඳම ශිෂ්‍යාව ලෙස 10 ශ්‍රේණියේ ඩබ්.ඩබ්. ලක්ෂාණි නවෝද්‍යා දුටුතිස්ස ශිෂ්‍යාව ඇගයීමට පාත්‍ර වූවාය.

## ජාතික යෞවන සමාජ ක්‍රීඩා උලෙළේදී විශිෂ්ට ජයක්

2019.06.09 වන දින පැවති ජාතික යෞවන සමාජ ක්‍රීඩා උළෙලේදී විදුනි උමංදා ශිෂ්‍යාව දුර පැනීමෙන් ප්‍රථම ස්ථානයත් රශ්මි සේනානායක ශිෂ්‍යාව මීටර් 100 සහ මීටර් 200 හා ධාවන ඉසව්වෙන් ප්‍රථම ස්ථානයත් දිනාගත්හ. මලල ක්‍රීඩා භාර ඩී.එම්.ආර්. නිල්මිණි ගුරු මෑණියන් හා ක්‍රීඩා භාර ආචාරිනී ඩබ්.එන්. කෞෂල්‍යා ගුරු මෑණියන් මෙම ජයග්‍රහණය සඳහා මග පෙන්වූ අතර ජයග්‍රාහී සිසුවියන් හට සුබ පැතුම් පිරිනමමු.

## YBTER නව නිපැයුම් තරගාවලියෙන් විශිෂ්ට ජයග්‍රහණ රැසක්




කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජ විද්‍යා පීඨය මගින් පවත්වන ලද Young Business Technology & Entrepreneurial Researches (YBTER) තරගාවලියෙන් අප විද්‍යාලයීය සිසුවියෝ අප පාසල වැඩිම ජයග්‍රහණ ලබා ගත් පාසල බවට පත් කළහ. එහිදී කේ.ආර්.එස්.ඩී. කස්තොට, ඩබ්.ඩබ්.එල්. දුටුතිස්ස හා ඩී.ඒ. මදීරා ගොවින්දි දුනුආරච්චි යන ශිෂ්‍යාවන් රන් පදක්කම් තුනක් ද, ඩබ්.එම්. කුමුද්‍යා මියුලි, ඩබ්.ඒ.එස්. අමරසේකර, කේ. සනුලි පෙරේරා සහ ඩබ්.ඒ.යූ.එම්. වික්‍රමආරච්චි යන ශිෂ්‍යාවන් රිදී පදක්කම් හතරක් ද ඩබ්.කේ.යූ. රංගනා, ඊ.එම්.ඒ.එස්. එදිරිසිංහ සහ

02 පිටුවට

## "සවිස්කාරා" නව නිපැයුම් තරගයෙන් ජයග්‍රහණ රැසක්



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ තාක්ෂණික විද්‍යා පීඨය මගින් පැවැත්වූ "සවිස්කාරා" නව නිපැයුම් තරගාවලියේදී 6-9 කාණ්ඩයේ දෙවන ස්ථානය කේ.ආර්.එස්.පී. කස්තොට ශිෂ්‍යාවත්, 10- 12 කාණ්ඩයේ දෙවන ස්ථානය ඩබ්.ඩබ්.එල්. දුටුතිස්ස ශිෂ්‍යාවත්, 6-9 කාණ්ඩයේ තුන්වන ස්ථානය ඩබ්.කේ.වී. රංගනා හා ඊ.එම්.ඊ.එස්. එදිරිසිංහ යන ශිෂ්‍යාවනුත් දිනාගැනීමට සමත් වූ අතර සහකාර විදුහල්පති තරංග දුනුආරච්චි මහතා ජයග්‍රහණය සඳහා සිසුවියන් මෙහෙයවීය. ඉදිරි ජයග්‍රහණ සඳහා විද්‍යාලයේ උණුසුම් සුබපැතුම් පිරිනමමු.

## සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියෙන් සමස්තලංකා ජයග්‍රහණ



එම්.ටී. මෙත්වරී යෙනුලි



ජේ.ටී. ඔනෙලි අයත්මි

2018 වර්ෂයේ සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියේදී අප විද්‍යාලයීය සිසුවියන් විශිෂ්ට ජයග්‍රහණ රැසක් හිමිකරගත්හ. එහිදී එම්.ටී. මෙත්වරී යෙනුලි (10 ශ්‍රේණිය) සහ ජේ.ටී. ඔනෙලි අයත්මි (6 ශ්‍රේණිය) යන ශිෂ්‍යාවෝ පද්‍ය නිර්මාණය හා අවබෝධය තරගයෙන් සමස්තලංකා

02 පිටුවට



## සමස්ත ලංකා බැඩ්මින්ටන් ජයක්

2019-07-13 සහ 14 යන දෙදින පැවති සමස්තලංකා බැඩ්මින්ටන් තරගාවලියේදී තෙවන ස්ථානය හිමිකර ගැනීමට අප විද්‍යාලයීය බැඩ්මින්ටන් කණ්ඩායම සමත් වූ අතර බැඩ්මින්ටන්

02 පිටුවට



# කතුවැකිය

දිනෙන් දින පරිණාමය වන සමාජ පරිසරය තුළ ඔබ ඔබට හිමි ස්ථානය කුමක්දැයි හඳුනාගත්තාද? එය ඔබට වැදගත් වන්නේ ඔබ තබන සෑම පියවරක්ම සමාජයීය ප්‍රගමනයට ඉවහල් වන නිසාය. නැතහොත් සමාජයේ පරිහානියට රුකුලක් වන නිසාය.

ඔබ ඔබේ ගෙවත්තෙහි රෝපණය කරන්නේ මල් පැළද? නැතහොත් වල් පැළද? ඔබ සිනාසෙනු ඇත. ඔබේ සුන්දර ගෙඋයනෙහි වල්පැළ රෝපණය කිරීමට ඔබ කිසිසේත්ම උත්සාහ නොදරන හෙයිනි. එහෙත්... ඔබ නොදැනුවත්වම වල් පැළද මල් පැළ අතරම පසෙහි සාරය උරාබොමින් උඩට ඇදෙන්නේ සමස්ත විශ්වයම අසුන්දර හා අමිහිරි තැනක් කිරීමේ අපේක්ෂාවෙනි.

ඔබ සිටින්නේ සැබෑ ලෝකයේද නැතහොත් න්‍යායික ලෝකයේද? ඔබ ඔබ විසින් නිර්මාණය කරගත් න්‍යායික ලෝකයක දිවිගෙවන්නෙකු නම් සමාජය ඔබට අනවශ්‍ය දෙයකැයි ඔබ සිතනු ඇත. මන්ද ඔබ සිටින්නේ ඔබේ රාමුව තුළ නිසාය. එහෙත් මෙලොව උපදින සෑම මිනිසෙකුම සාමාජයීය සත්වයෙක් වන බව අමතක නොකරන්න.

''මම ඔබව කඩා බිඳ දමා අලුතින් නිර්මාණය කරමි.''

ලේකඛයා සමාජයට කීවේය. ඔහු සමාජයීය වෙනසක් ඇති කිරීමට මුලපුරයි. එහෙත්,

''නැත, මම ඔබව කඩාබිඳ දමා අලුතින් නිර්මාණය කරමි.''

සමාජය ලේකඛයාට කිව්වේය. මේ, මහගම සේකර ශූරීන් විසින් සිය සමාජමය දෘෂ්ටිය විදහා පෑ අවස්ථාවකි. සමාජීය බලපෑම කොතෙක් දුරට මිනිසා කෙරෙහි බලපවත්වන්නේද යන්නට මෙම වැකි දෙක හොඳම නිදසුන්ය. ඔබට හොරෙන් වල්පැළ ඔබේ ගෙවත්ත ආක්‍රමණය කරන්නේ යම් සේ ද සමාජයෙහි අතැම් ආකල්ප, මතිමතාන්තර මෙන්ම දුර්ගුණද ඔබේ මනසට ඇතුළු වීම වැළැක්විය නොහැකිය. හංසයා දියෙන් කිරි වෙන් කරගන්නාක් මෙන් ඔබද සමාජ රැල්ල ඔස්සේ ගසාගෙන එන දූවිලි අංශුවලට ඔබේ මනස විවෘත නොකළ යුතුය.

ඔබ මේ වන විටත් නවීන අංගෝපාංග සහිත සුරතල් ජංගම දූරකථනයක හිමිකරුවෙකු විය හැකිය. මේ ටිකිරි සුරතලාට ඔබ බොහෝ ආදරය කරනු ඇත. මේ සුරතලා ඔබව ඔබටත් නොදන්නා නන් දෙස් කරා රැගෙන යනු ඇත. ඔබ ශක්තිවන්තයෙක්ද? දුර්වලයෙක්ද? ඔබ ශක්තිවන්තයෙකු නම් ඔබට ඔබේ සුරතලාව පාලනය කරගත හැකි විය යුතුය. ඔහු ඔබව රැගෙන යන්නට පෙර ඔබ ඔහුව ඔබට අවශ්‍ය ස්ථානයෙහි රඳවා තැබීමට බුද්ධිමත් විය යුතුය.

ඔබේ සිත නැමැති උයනෙහි මල්පැළ අතරම වැඩෙන කුඩා වල්පැළ මුලිනුපුටා දැමීමට ඔබ ධෛර්යවන්තයෙකු වන්න. එවිට මල්පැළ වඩා දීප්තිමත්ව හා ප්‍රභාශ්වරව දිලෙනු ඇත. මේ විසල් විශ්වය තුළ ඔබට හිමිවිය යුතු නිවැරදි තැන ඔබ හිමිකරගෙන ඇතැයි යන තුෂ්ටිදායක සිතුවිල්ලෙන් ළය පුරවාගන්නට තරම් ඔබ භාග්‍යවන්තයෙකු වන්නේ එවිටයි.

> හෙළ දිවයින ලොව බබළන්නේ ඔබ එහි ගුණගරුක දියණියන් වූ විටයි.
>
> **විදුහල්පතිනියගෙන්...**

## ඉසිඹු ලැබූ ගුරු තරු



**ඊ.එම්.ආර්. එදිරිසූරිය මයා**
**2012.02.16 දින සිට 2019.02.05 දින දක්වා අප පාසලේ සේවය කොට පසුගියදා ගුරු සේවයෙන් විශ්‍රාම ලැබුවේය..**

**පළමු පිටුවෙන්**

## සිංහල භාෂා හා සාහිත්‍ය තරගාවලියෙන් සමස්තලංකා ජයග්‍රහණ

අනුශූරතාව ලබා ගත් අතර අයි. උපේක්ෂා ප්‍රහර්ෂි පෙරේරා (11 ශ්‍රේණිය) පද්‍ය නිර්මාණය හා අවබෝධය තරගයෙන් සමස්තලංකා කුසලතා සහතිකයද, අයි.බී. සත්සරණි දුල්ෂිකා (12 ශ්‍රේණිය) භාෂා භාවිතය හා අවබෝධය තරගයෙන් සමස්තලංකා කුසලතා සහතිකයද, එම්.ඒ.පී. භාග්‍යා කෙටි නාට්‍ය පිටපත් තරගයෙන් කුසලතා සහතිකයද දිනාගනිමින් විද්‍යාලයට කීර්තියක් අත්කර දුන්හ. ජයග්‍රහණ පසුපස හිඳිමින් ඔවුන් දිරිමත් කළ විද්‍යාලයීය සිංහල අංශයේ ගුරු මෑණිවරුන් හා ගුරු පියාණන් හටත් ජයග්‍රාහී සිසුවියන් හටත් සුබපැතුම් පිරිනමමු.

## YBTER නව නිපැයුම් තරගාවලියෙන් විශිෂ්ට ජයග්‍රහණ රැසක්

ජේ.කේ.එච්. ජයකොඩි යන ශිෂ්‍යාවන් ලෝකඩ පදක්කම් දෙකක් ද දිනා ගනිමින් මෙම ජයග්‍රහණය තහවුරු කළහ. විද්‍යාලයීය සහකාර විදුහල්පති තරංග දුනුආරච්චි ගුරු පියාණන් විසින් ශිෂ්‍යාවෝ ජයග්‍රහණය කරා මෙහෙයවන ලදහ.

## සමස්ත ලංකා බැඩ්මින්ටන් ජයක්

ක්‍රීඩාව භාරව කටයුතු කරන පිල්කා ගුණසේකර ගුරු මෑණියන්, ක්‍රීඩා භාර ආචාරිනීන් වන ඉෂානි ගමගේ ගුරු මෑණියන් හා ඩබ්.එන්. කෞශල්‍යා ගුරු මෑණියන් ඇතුළු ජයග්‍රාහී සිසුවියන් හට උණුසුම් සුභපැතුම් පිරිනමමු.

## සංස්කාරක මණ්ඩලය

**ප්‍රධාන උපදේශක** - එච්.එම්. ගයානි වත්සලා මිය (විදුහල්පතිනිය)

**සංස්කාරක මණ්ඩලය** -
1. මාධවී රූපසිංහ මිය (සහකාර විදුහල්පතිනිය)
2. සුමුදු හේරත් මිය
3. විචිත්‍රා මාපිටිගම මිය
4. චින්තා කුමාරිහාමි මිය
5. කේ.ඒ. රසිකා සිරිවර්ධන මිය

**සිසු කමිටුව** -
1. ඊ.ඒ. හංසනී පියුමිකා
2. කේ.කේ. සියුමි සෙව්මිණී කීරවැල්ල
3. නෆීෂා අෆ්ෂාරා අහමට්
4. හිරුෂි අමාෂා
5. ලක්ෂාණි නෙත්මි
6. පබසරා සෙව්වන්දි
7. අයෝධ්‍යා යොමාලි
8. හිරුණි පූර්ණිකා
9. තරුෂි පූර්ණිමා
10. ශනාලි තත්සරණි
11. කල්පනා විජයලත්
12. හංසිකා රත්නායක

**සාර්ථකත්වය යනු ළඟා කරගත යුතු දෙයක් මිස නොමිලේ ලැබෙන දෙයක් නොවේ.**




# ගුණ නුවණ නොවැඩීම



ලැබූ මනුෂ්‍ය ජීවිතය සැනසිලිදායක කර ගැනීමට කායික නිරෝගී බව මෙන්ම, මානසික නිරෝගී බවද අත්‍යවශ්‍ය වේ. කය නිරෝගීව පවත්වා ගැනීමද එහි මනා වැඩීමද පිළිබඳව දැනුවත් වීම අත්‍යවශ්‍ය වේ. එසේ නොමැති වීමෙන් නුසුදුසු ආහාර පාන ආදියෙන් ඔබගේ ශරීරය කොපමණ නිරෝගීව පැවැතුණද මනස නිරෝගීව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මනස නිරෝගීව පවත්වා ගැනීමට නම් "ප්‍රඥාව" හෙවත් කුසල අකුසල ධර්මයන් කෙරේ මනා අවබෝධයක් ලබා ගැනීම අවශ්‍ය වේ. එනම් කුසල ධර්මයන් කෙරෙහි සිත පුරුදු පුහුණු කළ යුතුය.

සුදුසු වයසේ පටන් පාසැල් අධ්‍යාපනයක් හා දහම් අධ්‍යාපනයක් අවශ්‍ය පරිදි නොලැබීම නිසා පුද්ගලයෙකු ප්‍රඥාවෙන් හීන වේ. මෙසේ පාසල් හා දහම් අධ්‍යාපනයේ නොයෙදීමට කරුණු කිහිපයක් බලපෑ හැකිය. එනම් අලසකම, සිහිය නිවැරදිව නොපවතීම, දුසිල්වත් හෙවත් පවට බර වීම, අසංවරය ආදියයි. සමහරු කම්මැලිකම හෙවත් අලසකම නිසා ඉගෙනීම නිසි සේ නොකොට, කකා, බිබී, නිදාගනිමින් නිකරුණේ වාඩිවී සිටිමින් හිස් වචන කථා කරමින් කාලය ගත කිරීමට පුරුදු වී සිටිති.

යම් දරුවෙක් පාසල් ගියදා, අලසවීම නිසා අධ්‍යාපනය නිසි ලෙස සම්පූර්ණ නො කර ගනියි. එවිට ඔහු හෝ ඇය ගුණ නුවණින් හීනවෙයි. මෙවිට සිදුවන්නේ කුමක්ද? හිස් ඔලුවක් හා විශාල සිරුරක් ඇති නිකම්ම, නිකම් මනුෂ්‍යයෙකු බිහි වීමයි.

සමහර අයට අධ්‍යාපනයක් ඇති නමුත්, ගුණ නුවණේ අඩු බවක් දැකිය හැක. වර්තමානයේ බාහිර අධ්‍යාපනය ලැබීමේදී ශිෂ්‍යයා තරගකාරී බවට පත්වන බව පෙනේ. එහෙත් එයින් නියම ප්‍රයෝජනය නොගන්නා බවද පෙනේ.

මෙසේ නිසි අධ්‍යාපනයක් නොලැබූ ගුණ නුවණ දියුණු නොකර ගත් පුද්ගලයා මස් පමණක් වැඩුණු හිස් අයෙකි. එමෙන්ම අධ්‍යාපනයක් ලැබුවද ආධ්‍යාත්මික දියුණුවක් නැතිනම් ඔහු හෝ ඇයද ධර්මයට අනුව යහපත් අයෙක් නොවේ. එවැනි අයගේ කයත්, මොළයත් වැඩුණද "මනස" වැඩී නැත. එම නිසා රාග, ද්වේශ, මෝහ ගිනිදැල්වලින් ඔවුන් ඇවිලෙනු ඇත. තරහවෙන්, ඊර්ෂ්‍යාවෙන්, ගුණමකු කමෙන්, වෛරයෙන්, බැඳෙනු ඇත. ඔවුහු මංමුලා වූවෝය.

නොවැඩුණු මනසක් නිසා ඇතිවන ආදීනව ධම්ම පදයේ මෙම ගාථාවෙන් පැහැදිලි වේ.

"නත්ථි රාග සමෝ අග්ගී
නත්ථි දෝස සමෝ ගහෝ
නත්ථි මෝහ සමං ජාලං
නත්ථි කන්හා නදී සමා"

**ධර්මපාල වීරසිංහ ගුරු මහත්මා**

# ජය දද නැංවූ යසෝදරාව

## සහසක් නිපැයුම් ජාත්‍යන්තර තරගයට සුදුසුකම්

ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම මගින් පැවැත්වූ බස්නාහිර පළාත් සහසක් නිපැයුම් තරගාවලියට සහභාගී වූ අප විද්‍යාලයේ ඩබ්.එම්.කේ. ගුණවීර හා ඩී.ඒ. මදීරා ගෝවින්දි දුනුආරච්චි යන ශිෂ්‍යාවෝ ජාතික තරගය සඳහා සුදුසුකම් ලැබූහ.

## නර්තනයෙන් පළාත් මට්ටමේ ජය

සමස්තලංකා නර්තන හා මුද්‍රා නාට්‍ය තරගාවලියේදී බස්නාහිර පළාත් ප්‍රථම ස්ථානය දිනාගැනීමට අප විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ නර්තන කණ්ඩායම සමත්විය. ඉදිරි

## පෙරදිග සංගීතයෙන් බස්නාහිර පළාත් ජයග්‍රහණ රැසක්

2019 ජුනි 29, 30 දිනයන්හි පැවති පෙරදිග සංගීතය, බස්නාහිර පළාත් තරගාවලියේදී විවෘත සමූහ වාදන (රාගාශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණ) අංශයෙන් ප්‍රථම ස්ථානයත්, ළිහිණි මිනෝදා ශිෂ්‍යාව විසින් විවෘත ශාස්ත්‍රීය ගායන අංශයෙන් දෙවන ස්ථානයත්, ජ්‍යෙෂ්ඨ අංශයේ භජන් ගායන තරගයෙන් කේතකී නිරෝධා ශිෂ්‍යාව දෙවන ස්ථානයත් හිමිකරගත්හ. එසේම විවෘත ශාස්ත්‍රීය යුගල ගායනා තරගයෙන් ප්‍රභාෂි විදුමිණි හා ළිහිණි මිනෝදා යන ශිෂ්‍යාවෝ දෙවන ස්ථානය දිනාගනිමින් විද්‍යාලයට කීර්තියක් ගෙන දුන්හ. ඉදිරි ජයග්‍රහණ වෙනුවෙන් මෙසේ සුබපැතුම් පිරිනමමු.

## අන්තර්පාඨශාලයීය විවාද තරග ජය

ගම්පහ මහනගර සභාව විසින් සංවිධානය කරනු ලබන ගම්පහ දිස්ත්‍රික් අන්තර් පාඨශාලයීය විවාද තරගාවලියේදී කඳාන මැසනඩ් විද්‍යාලය පරදා ජයග්‍රහණය ලැබීමට අප විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ විවාද කණ්ඩායම සමත් විය. ඉදිරි ජයග්‍රහණ වෙනුවෙන් සුබ පැතුම්.

## මයිලෝ කුසලාන නෙට්බෝල් තරග ජය

2019.07.21 වන දින පැවති මයිලෝ කුසලාන නෙට්බෝල් තරගාවලියේදී අප පාසලේ 13න් පහළ නෙට්බොල් කණ්ඩායම ගම්පහ දිස්ත්‍රික් ශූරතාව දිනාගත්හ. සමස්තලංකා ජයග්‍රහණ සඳහා සුබපැතුම් පිරිනමමු.

## සමස්ත ලංකා බටහිර සංගීත තරග ජය

2019 සමස්තලංකා බටහිර සංගීත තරගාවලිය 2019.06.28 වන දින කොළඹ ආනන්ද බාලිකා විද්‍යාලයේදී පැවැත්වුණු අතර එහිදී මෙලෝඩිකා කනිෂ්ඨ (සමූහ) තරගයෙන් බස්නාහිර පළාත් තෙවන ස්ථානය දිනා ගැනීමට අප විද්‍යාලයීය කණ්ඩායම සමත් විය.

සාර්ථක මිනිසෙකුගේ නැගී සිටීම ආරම්භ වන්නේ අසාර්ථක වූ පසුවය.

කෙටි කථාව

# පයිලට් පනස්පහ තීන්ත පෑන




සුපුරුදු පරිදිම හතරේ කණිසමට අවදි වූ ශාන්ති වෙනදා මෙන්ම නිදිබර ගතියෙන් අතට අසුවූ සායක් හා බ්ලවුසයක් උඩින් පල්ලෙන් ඇඟට දමා ගත්තාය. සැමදා එකම කාල චක්‍රයට අනුව කැරකෙන ශාන්තිගේ ජීවිතයට, ඇගේ නිවහන තිබූ විජේරාම මාවතේ කාන්තා සමිතිය හේතුවෙන් මඳ විරාමයක් දෙනන්ට සිදුවිය. අවසානයේ ඔවුන් හතේ කණිසම වනවිට ප්‍රදර්ශන භූමියේ සිටියහ. වැඩි කතාබහක් නොමැති ශාන්ති විවිධ ආටෝප, ව්‍යාජ සිනහවන්, වියත් කතාබස් අතරේ ඉදිරියට ඇදෙන්නට වූවාය. තමා විශ්වාස කළ තම ස්වාමිපුරුෂයා සමඟ විරසක වීමත් සමඟ ඇයගේ ජීවිතය වැඩිහරියක් ගෙවුණේ, කන්තෝරු කාමරයේ පරණ ෆයිල් ගොඩවල් අතරය.

පරණ දුර්වර්ණ වූ ෆයිල් කවරයක් සේ ඇයද අවුරුදු දෙකට අවුරුදු දහයකින් දිරාපත් විය. එය ඇය උඩින් පල්ලෙන් දැමූ සිනහ මැවෙන කල්ඉතුත් වූ පිච්ච මල් පුයර වලින්ම පෙනිණ. එකවරම ශාන්ති තිගැස්සුණාය. ඒ ප්‍රදර්ශන භූමියේ තිබූ පරණ නමුත් අගනා රන් පැහැගත් පෑනක් නෙතගැටීමත් සමඟය. ඇයගේ මුහුණ සුදුමැලි විය. දහඩිය උතුරා ගියේය. එම පෑන යටින් පයිලට් - පනස්පහ ලෙස නම්කර තිබුණේය. ඇය කිසිවෙකුටත් නොපවසා තම මොරිස් මයිනර් නම් අබලන් වූත් නමුත් තවමත් දුවන කාරයට නැඟගත්තාය. රථය කෙමෙන් කෙමෙන් 'ලින්දර' නම් ඒ සොඳුරු ගම්මානය වෙත ඇදෙන්නට විය. පැය දහයක පමණ ගමනකින් පසුව ඈ කුමුදු මලින් පිරුණු හා නෙලුම් මලින් බරවූ විලක් අසල තම කාරය නැවත්තුවාය. ඊට ඉහළින් ගලක් උඩ තිබෙන ගලේ පන්සල ඇගේ නෙත ගැටිණ. නෙලුම් විල නම් මීට අවුරුදු තිස්පහකට පෙර සේම දිස් විය. වෙනසකට තිබුණේ ගල් පේළියකින් හා විලට බැසීමට ඇති ගල් පඩිපෙළකින් විල අලංකෘත වීම පමණය. කුඩා කොලු පැටවුන් සරම් කොට හැඳ ජල ක්‍රීඩාවේ යෙදුණේ අවුරුදු පහළොවක්ම කුණුදුවිලිවලින් නැහැවුණු ෆයිල් ගොඩකින් වැසී සිටි ශාන්තිගේ සිතට මෙන්ම මුවටද මඳ සිනාරැල්ලක් එක්කරමිනි.

ගලේ පන්සල මීට අවුරුදු ගණනකට පෙරසිටම පැවතියේ මෙහෙණින්වහන්සේලා වැඩසිටි ආරාමයක් ලෙසටය. ක්ෂණයෙන්ම, සුපුරුදු පරිදි සක්මන් භාවනාව වඩන ලොකු මෙහෙණින්වහන්සේ ශාන්තිගේ නෙත ගැටිණි.

ඇය ආරාමය වෙත වැඩ බුදුන් නැමැඳ, අවට පරිසරය මුළු හදවතින්ම වැළඳ ගත්තාය. ශාන්ත ස්වරයකින් ඇය අමතනු ඇසී පියවි සිහියට ආ ශාන්ති තමා අසල සිටින මෙහෙණින්වහන්සේ දෙස නෙත්හෙළා බලාසිටියාය. ඇයට හුරුපුරුදු ගතියක් දැනුණේය. මෙහෙණන් වහන්සේ විසින් ''ඔබ මෙහේ කෙනෙක්ද?'' යනුවෙන් විමසන ලද පැනයට ''නෑ... මම කොළඹ'' ලෙස පවසා නමස්කාර කොට ගල පාමුලට ගියාය. එහිදී ඇයට පන්සලේ ඇබිත්තිය මුණගැසුණේය. තම සිතට දැනුණු කුකුස පහකරගැනීම සඳහා ඇය මෙහෙණින් වහන්සේ පිළිබඳව ඇයගෙන් විමසුවාය.

''අනේ, නෝනේ, අපේ ලොකු මෙහෙණින්වහන්සේ හරිම පින්වන්ති. එතුමියගේ අප්පච්චි මේ ගමේ හිටිය මිනින්දෝරු මහත්තයා වෙච්චි. එතුමියට සහෝදරියන් දෙදෙනෙක් හිටියා නොවැ. ඇගේ මවත් සීදේවි නෝනා. කරුමෙක මහත. අහෝ ඒ උත්තමයා වසංගත රෝගයට ගොදුරු වුණා නොවැ. මෙතුමියට වඩා වැඩිමල් සහෝදරියක් සිටියා. ඒකි විස්සවිජ්ජාලේ ගොහින් ආයේ මෙහෙ පයක් ගහලා නෑ. අනේ ඉතින් අම්මයි නංගියි බලාන අමාරුවෙන් දිවි ගැටගහගත්තා. අම්මාත් අංසබාගේ හැදිලා වියෝ වුණා. අසරණ කෙල්ල, නංගිත් එක්ක කුමක් කොරන්ටද? අනේ සීදේවි කෙලි පොඩිත්ත අවුරුදු දහයෙන්ම සසුන්ගත වුණා... අවාසනාවේ තරම. අනේ අම්මා අප්පා නැති පොඩි කෙල්ල ගොළු වෙලා බලාගත් අතම බලන් හිටියා..''

එවිටම ශාන්ති නෙතගැටුණේ වුරුදු දාහතක් පමණ වන ගැහැනු දරුවෙකු ගලමුදුනේ හිඳ අතේ දිළිසෙන යමක් රැගෙන ඉන්නා බවකි. ඇය නෙතින් ගිලිහෙන කඳුළු පිසදා ගල මුදුනට අඩියෙන් දෙකෙන් ගියාය. පුදුමයකි, පයිලට් පනස්පහ තීන්න පෑන අතැතිව දරුවා අනන්තය දෙස බලා සිටියාය. ශාන්ති කඳුළු සලමින් නැවත හැරී ගොස් තම මොරිස් මයිනර් කාරය පණ නගා හැකි වේගයෙන් නොපෙනී ගියාය.

විජේරාම මාවතට පිවිසි ඈ අන්ධකාරයේම වාහනය නවතා දෙනෙත් වසාගත්තාය. තම ආදරණීය පියා තමාගේ උසස්පෙළ විභාගය දා තමා අත තැබූ පයිලට් - පනස්පහ තීන්ත පෑන ඇයට සිහිවිය. එතරම් වටින තම පියා දුන් පෑන අමතක කරදමා ගෙදරින් පිටව ආ තමා තමාගේ පවුලම අමතක කරදමා හුදු ප්‍රීතියක් හා ආටෝපයක් ඉදිරියේ හිසනැමූ ආකාරය ඇයට සිහිපත් විය. ගතවූයේ නිමේෂයකි. තම මොරිස් මයිනර් රථය පණගන්වා ගත් ඈ නැවත ඇබිත්තියගේ කතාව සම්පූර්ණ කිරීමට ගියාය.

කේ.කේ. සියුම් කීරවැල්ල
13 - K




## ආදර සුදු දියණියනි,

මා මලක් ලෙස නුඹ නොහැදුවේ
පෙති හැලී පොඩි වන නිසාමයි
දුක දිනා..... හිනැහෙන හැටි දුවේ
නුඹ දැන උගත් පාඩම තමයි

මොහොතින්, මොහොත කාලය ඉගිලී යනවා. ඉර හඳ මහලු වෙනවා. ඒත් අපට ඒ ගැන හිතන්න වෙලාවක් නෑ. අපි ඉන්නේ අනාගත බලාපොරොත්තු පුරවා ගත්තු ලෝකයක. ඉතින් සුදු දෝණි, හැම අම්මෙකුටම හිතෙන්නේ තමාගේ දුව පරනොවන මලක් කියල. පෙති ගිහිහෙනවට කැමති නැත්තෙ හදවතේ සෙනෙහස වැඩි නිසාමයි. ඒත්....

රෝස මල් පියල්ලක
සතපලා නළවලා
සනසන්න, නොසිතන්න
දියණියනි, ජීවිතය

අප යන මාවතේ... කටු පඳුරු බහුලයි. ඒ සියල්ල සිඳ බිඳ අප ඉදිරියට යා යුතුයි. එහෙත්... එය සිතන තරම් පහසු දෙයක් නොවෙයි. ජීවිතය ජය ගන්නව කියන්නෙ ඔබේ සිතේ නොසැලෙන ශක්තියයි. ඉතින්... මගේ සුදු දෝණි, ඔබ තවම ජීවිතය දිහා එබිකම් කරල බලනව විතරයි. ඔබට යන්න තියන ගමන දුරයි. හැම අම්ම කෙනෙකුගේම බලාපොරොත්තුව පැතුම තමන්ගේ දුව සමාජයේ ඉහළම තැනක ඉන්නවා දකින්නයි. ඒත් ඒ.... ධනවත් කමින් උගත් කමින් නම් නොවෙයි. ගුණ යහපත් කමින් හොඳ හැදියාවකින් දෙමාපියන්ගෙ ගෞරවය, අකුරු කරපු ගුරු දෙවිවරුන්ගෙ ගෞරවය වගේම උපන් බිමේ ගෞරවය රැකීමෙන්, එහෙම වෙන්නෙ ඔබ මිනිසත් බවින් පිරුණු යහගුණ සපිරුණු හෙළ දියණියක වූ විටයි.

නෙත කඳුළු පිසලන්න
මසිත පිරී මැද ලන්න
සැමදා ළඟින් ඉඳ මගේ
මගෙ පණ ඔබයි දියණියේ

සුදු දෝණි, දුව සුදු ගවුම ඇඳල කොණ්ඩ කරල් දෙක ගොතල පාසල් යන්න ලෑස්ති වෙනකොට, මට දුව ගැන හිතට දැනෙන්නේ ලොකු ආඩම්බරයක්. ඔයාව අවදි කරවන්න. ඔයාට අතට පයට හැම දේම දෙන්න, මට වේලාව මදි. ඒ කටයුතු හැමදේම ඔයා කරගන්නෙ තනියම. සමහර දූලට හැමදේම අම්ම කරල දෙන්න ඕනේ කියල සමහර අම්මලා කියන කතාව මම ඇහෙනව. එත්... මගේ සුදු දෝණි ඔයා අම්මගෙ අවිවේකී බව රැකියාවේ වගකීම තේරුම් ගත්ත හොඳ දුවෙක්. ඔයාට වගේම ඔයා අම්මට තාත්තට ගෙදරට ලොකු ශක්තියක්. ''නෙත කඳුළු පිසලන්න කීවේ සතුටු කඳුළු. මම පේනව ඔයා ඉගෙනුම් කටයුතුවලට දක්වන ඕනකම, උනන්දුව, වගකීම මට දකින ඔයාගෙ අනාගත සිහිනය නම් දැනුම කුසලතා වගේම යහපත් ආකල්පවලින් පිරුණු ගුණගරුක මුදු මොළොක් හදවතක්. ඉතින් සුදු දෝණි. අපි ඉන්නෙ කාර්ය බහුල සමාජයක. සමහර අම්මල තමන්ගෙ දුවල පාසලට යනකොට, පෞද්ගලික පන්තියට යනකොට දුවල ඒ තැන්වලට එක්කරගෙන යනවා. සමහර අම්මල ඒ කාලය ගෙවෙනතුරු ඒ තැන්වල රැඳිල ඉන්නවා. ඒ තමන්ගෙ දුවට ආදාරයටමද? නැත්නම් තමන්ගෙ දියණිය ගැන පපුවෙ ලියවිලා තිබෙන අසුබ දේවල් නිසාද?

සුදු දෝණි, තරුණ සිත්වලට දැනෙන හැඟීම් විවිධාකාරයි. තරුණ වියේ පසුවන හැම දුවෙක්ම ඉන්නෙ ඔය හැඟීම් එක්ක.

ජීවිත කතර යන මග අතර
හමුවේ නිතර....
සිනා පිරිවත
දොඩන නෙක වදන්
පිනවන දෙසවන්
දයාබර දියණියේ
එහෙත්,
නොපෙනේ කිසිවිට
හදවත විනිවිද

බොහෝ දුර බැහැර ගොස්
විඩාවී සන්සුන්ව ඉඳ.....
නොතැවෙන්න
කල් යල් ඇතිව
බුද්ධියෙන් දකින්න.

මායා පටලයෙන් වැසී
සැඟව ඇති
ලොව හදවත්
බිඳක් හෝ විනිවිද

එහෙත් මට හිතෙනවා, මගෙ සුදු දුව කවදාවත් අම්මගෙයි තාත්තගෙයි පපුවෙ ඔයා ගැන ලියවිලා තියෙන ඒ ලස්සන ගී පද කුරුටු ගාල මකල දාන්නෙ නැති වෙයි කියල. ඉතින් සුදු දෝණි, හැම වෙලාවකට තීන්දු තීරණ ගන්නකොට ඉක්මන් වෙන්න එපා. ඒ ගැන දෙතුන් පාරක් හිතන්න. යාළුවෝ, යෙහෙළියො තෝර ගන්නකොට හුඟක් පරිස්සමින්. ''අගේ ඉඳන් කන කන'' ''කපන්න බැරි අත සිඹින'' සමාජයක පරෙස්සමෙන්... තමයි කරන කියන දේවල් තෝරා බේරා ගන්න ඕනෙ. එහෙම කිව්වයි කියල මගෙ දුව හැමෝම දිහා සැකෙන්, බියෙන්, වපරැසින් බලන්න එපා. බුද්ධිමත්ව තේරුම් ගන්න උත්සාහ කරන්න. හොඳ යහළුවො දෙතුන් දෙනෙක් හිටියාම ඇති. දුකේදී පිහිටවන සැපේදී සතුටු වන, අනිත් අය බැහැර කරන්න කීව නෙවෙයි. තේරුම් අරගෙන අතේ දුරින් ඇසුරු කරන්න. ආඩම්බරකම ගැහැනියකට ආභරණයක් කියල වදන් පෙළක් දැකපු මතකයක් මට තියෙනවා. අදට මේ වචන පෙළ කොයිතරම් ගැළපෙනවද නොගැළපෙනවද කියල ඔයත් හිතල බලන්න.

හැම දෙමව්පියෙක්ම වත් පොහොසත්කම්වලින් එක හා සමාන නෑ. සමහර දරුවො ලොකු වටිනාකම් තියෙන දේවල් ඉල්ලල දෙමාපියන්ට අප්‍රමාණ දුක් වේදනා දෙනවා මට ඇහිල තියෙනව. එහෙත් දරුවො දෙමව්පියන්ට ගුරුවරුන්ට සමාජයට වදයක් නොවී ජීවිතය හසුරව ගන්නව නම් කොයිතරම් සතුටක්ද, මගේ දෝණි ගැන මම ආඩම්බර වෙන්නෙ ඒ හින්දනේ.

ඉතින් සුදු දෝණි පත පොතින් විතරක් නෙවෙයි ජීවිතයෙන් අත්දකින්න ඕනෙ දුවෙක් වුණාම. මිදුලෙ මල් පැළයක් ඉන්දල මලක් පිපුණාම ලබන සතුට, ලස්සන හරවත් ගීතයක් රංගනයක් අහල බලල විඳින සතුට, මේ හැම දෙයක්ම අත් විඳින්න ඕනෑ....

ඉතින් සුදු දෝණි ඔයාට කියන්න පුංචි කවියක් මතක් වුණා.

කොපමණ ගුණ  කළත්
දුදනෝ නොවෙති  යහපත්
කිරි දියෙහි  දෙවියත්
අඟුරු සුදුවෙන කලෙක් නම්  නැත්

අපි කොච්චර උදව් උපකාර කළත් සමහර වෙලාවට සමහරු ඒක සුළු මොහොතකින් අමතක කරල දානව. එතකොට අපට හරියට දුක හිතෙනව. හිතේ කලකිරීම් ඇති වෙනවා. සමහර යහළුවො එහෙම කරනව. එත් හැමෝම නෙවෙයි. එත් අවස්ථාවෙ හැටියට යම් දේවල් අපට කරන්න වෙනව. එත් හිතා මතා පරෙස්සමෙන්.

සිප් ගන සයුර ජයගෙන දිරියෙන්ම  දුවේ
රැජිනක් ලෙසින් පළඳිනු මැන කිරුළ  ලොවේ
මව් සෙනෙහසට අන් කිසිවක් සමද  නොවේ
ගුණ නුවණින් පිරුණු පියුමක් වන්න  ලොවේ

මගේ සුදු දෝණි,

ජීවිතය දකින්න, ජීවිතය ජය ගන්න, හැමවිටම සාධාරණකමින්.

හැම අම්ම කෙනෙක්ගෙම, තාත්තා කෙනෙක්ගෙම එකම පැතුම තමයි තමන්ගෙ දුව සමාජයේ යහපත් දුවෙක් කියල ලබන ගෞරව නාමය. ඒ සතුට මගේ සුදු දෝණි අහිමි කරන්නෙ නෑ කියල මම දන්නවා.

මම ඔබට පෙවු හැම
කිරි බිඳට මුසු කළේ
දිරිය ශක්තිය සමඟ
නොසැලෙනා අරමුනයි
නුඹේ හදවත කොනක
ලියම් මම ඒ වැකිය

මගෙ සුදු දෝණිට තෙරුවන් සරණයි.

**මේ ඔබේ ආදරණීය අම්මා,**
**කේ.ඒ.එන්.එම්. කුරුප්පු**
**(ගුරු වෘත්තිය)**

# යසෝ පුවත්

## නෙළුම් මල් පූජාව ඇතුළු පිංකම් රැසක්

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝ සමිඳුන් උදෙසා යසෝදරා දේවි බාලිකා විද්‍යාලය මගින් පවත්වනු ලබන, වාර්ෂික නෙළුම් මල් පූජාව හා දානමය පිංකම රටේ පවතින ආරක්ෂක හේතු මත අවලංගු වීම නිසා ඊට සමගාමීව, 2019 ක් වූ පොසොන් මස 13 වන දින නෙළුම් මල් 2000 ක් පූජා කිරීමේ පුණ්‍ය කටයුත්ත විද්‍යාලයේ බුදු කුටිය අභියස ඉතා උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණු අතර පොසොන් මස 14 වන දින මැදගම සිරි සුනන්දාරාම විහාරවාසී සංඝරත්නය උදෙසා හීල් දානය පිරිනැමීමේ පුණ්‍ය කටයුත්තක්ද පැවැත්වුණි. එහිදී විහාරයේ නව ආවාසය තැනීම සඳහා මූල්‍ය පිරිකර පූජාවක්ද සිදු විය.

විද්‍යාලයේ 5 වසර, 11 වසර හා 13 වසරවල ශිෂ්‍යාවන් පෙනී සිටින විභාගවලින් ජය ලබා ගැනීමත්, විද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යාවන් ඇතුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සෙත් පැතීමත් අරමුණු කරගත් මේ සියලු පුණ්‍ය කර්මයන් ගරු විදුහල්පතිනියගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

මෙම අවස්ථා දෙකෙහිදීම මැදගම සිරි සුනන්දාරාමාධිපති ඉඳිගොල්ල විද්‍යාවංශ පිරිවෙන්පති පූජ්‍ය කිණිගම සමිත හිමියන්ගේ උතුම් සද්ධර්ම දේශනා පැවැත්විණි.

## 6,7,8,9 ශ්‍රේණි ක්‍රීඩා වැඩසටහන

2019 ජූලි මස 07 වන දින 6 ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යාවන් ද, 09 වන දින 8 ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යාවන්ද, 11 වන දින 9 ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යාවන්ද, 12 වන දින 7 ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යාවන්ද උදෙසා නවක ක්‍රීඩා පුහුණුකරුවන් යටතේ සියලුම ක්‍රීඩා හා අනු ක්‍රීඩාවලින් සමන්විත වන ලෙස ක්‍රීඩා වැඩටසහනක් පවත්වන ලදී.

## 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව වැඩසටහන

මෙම වසරේ ශිෂ්‍යත්ව කඩ ඉමින් විශිෂ්ට ජයක් ලැබීම උදෙසා 2019 ජූලි මස 03 වන දින සමීර ද සිල්වා ගුරුපියාණන්, අමිතා විද්‍යාරත්න ගුරුමෑණියන් සහ පද්මිණී නෙත්තසිංහ ගුරු මෑණියන් විසින් 5 ශ්‍රේණියේ සියලුම ශිෂ්‍යාවන් සඳහා ගණිත ගැටලු වැඩමුළුවක් ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ.

## 8,9, ශ්‍රේණි අත්කම් වැඩසටහන (ව්‍යාපෘති පාදක)

2019 ජූලි මස 07 වන දින 8,9 ශ්‍රේණි සඳහා අත්කම් වැඩසටහනක් 8-9 ශ්‍රේණි ගුරුභවතුන් විසින් පවත්වන ලදි. එහිදී 9 ශ්‍රේණියේ ශිෂ්‍යාවන් සඳහා වුල් ගෙතීම, රිබන් එම්බ්‍රොයිඩින්, පන්වලින් පැදුරක් විවීම ආරම්භ කරන ලද අතර 8 ශ්‍රේණියේ ශිෂ්‍යාවන් සඳහා ක්‍රොස්ටිච් මැසීම, පේපර් ක්විලින්, වුල් ගෙතීම සිදු කරන ලදි.

## ඇසළ පෙර පෙහොය වැඩසටහන

2019.07.15 වන දින 7 ශ්‍රේණිය සිසුවියන් හා පංතිභාර ගුරු භවතුන්ගේ සහභාගීත්වයෙන් පෙ.ව. 8.00 - 9.00 දක්වා ප්‍රධාන ශාලාවේදී ඇසල පෙර පොහොය වැඩසටහන පැවැත්විණ. එහිදී හේනෙගම ශ්‍රී භාග්‍යාරාමාධිපකාරී රාජකීය පණ්ඩිත පූජ්‍ය නීලම්මහර චතුර ශාන්ත හිමිපාණන්ගේ සුමධුර ධර්ම දේශනයකට සවන් දීමට ශිෂ්‍යාවන් හට භාග්‍ය උදාවිය.

## සුපිළිපන්න වැඩසටහන

2019.07.29 අල්ලස් හා දූෂණ වංචා විමර්ශන කොමසාරිස් නෙවිල් ගුරුගේ මහතාගේ ප්‍රධානත්වයෙන් "අල්ලස් හෝ දූෂණයෙන් තොර යහපත් සුපිළිපන්න සමාජයක්" තේමා කරගනිමින් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පවත්වන ලද වැඩසටහන සඳහා 9 ශ්‍රේණියේ සිසුවියන් 325 දෙනෙක් සහභාගී වූහ.

## Cooking Master වැඩමුළුව

2019.06.21 වන දින සිට 2019.07.05 වන දින දක්වා 7 ශ්‍රේණියේ සිසුන් උදෙසා Cooking Master වැඩමුළුව පවත්වන ලදී. එහිදී විවිධ පිටි වර්ග යොදාගනිමින් රොටී වර්ග කිහිපයක් පිළියෙළ කරගන්නා ආකාරය පිළිබඳ ශිෂ්‍යාවෝ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත්හ.

## විද්‍යා දිනය

Salitus යන්න තේමා කරගත් මෙවර විද්‍යා දිනය 2019 ජුනි 28 වන දින මහාචාර්ය සරත් කොටගම මහතාගේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ.

# සිංහරාජයේ වගතුග - 4

## සිංහරාජයට ගිය අපි

ශ්‍රී ලංකාවේ නිරිත දිග පහතරට තෙත් කලාපයේ පිහිටි අති විශේෂ ස්වාභාවික පාරිසරික වටිනාකමක් ඇති සිංහරාජය නිවර්තන තෙත් සදාහරිත වනාන්තරයකි.

සිංහරාජයට පිවිසීමට ප්‍රධාන මාර්ග තුනක් ඇත. ගම්පහ සිටින අපි කඩවත, දොඩන්ගොඩ, මතුගම, අගලවත්ත, බදුරලිය, කලවාන, වැද්දාගල මාර්ගයේ කුඩව දෙසින් සිංහරාජයට ළඟා වීමු.

අද වන විට සිංහරාජයේ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 1187 පමණ වේ. සිංහරාජය මුහුදු මට්ටමේ සිට උස මීටර් 90 සිට මීටර් 1170 දක්වා උච්චත්වයකින් පිහිටා ඇත. කඳු, හෙල්, ගල් ශිඛර, බෑවුම්, ගංගා ඇළ දොළ ආදී දැකුම්කලු භූගෝලීය ලක්ෂණවලින් මෙම වනාන්තරය සමන්විතය.

සිංහරාජ වනාන්තරය ස්වාභාව සෞන්දර්යයේ විස්මිත නිර්මාණයකි. එහි ඇති පාරිසරික විවිධත්වය විද්‍යාත්මක මෙන්ම ආධ්‍යාපනික වටිනාකමින්ද අසීමිතය. වාර්ෂිකව පාසල් දරුවන් සිය දහස් ගණනක් ද සංචාරකයින් විශාල සංඛ්‍යාවක්ද සංහරාජයේ පාරිසරික සෞන්දර්ය විඳගැනීමට පැමිණෙති. අප එහි ළඟා වන විටද දේශීය හා විදේශීය සංචාරකයෝ පැමිණ සිටියහ.

මෙම සුවිශේෂී අධ්‍යාපන චාරිකාව පිළිබඳ අදහස මුලින්ම විදුහල්පතිනි ගයනි වත්සලා මැතිනියට දැන්වූ පසු ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් සහ මඟ පෙන්වීම් මෙන්ම සම්බන්ධීකරණ කටයුතු ඉතාමත් ඕනෑකමින් සිදුකර දෙන ලදි. කොළඹ විශ්ව විද්‍යාලයට සම්බන්ධ සංරක්ෂණ හා අධ්‍යාපන උපදේශක අරුණ පත්මපෙරුම මහතාගේ දැනුවත් කිරීම අනුව එම ආයතනයේ වැඩසටහන් භාරව සිටින චන්ද්‍රලාල් මහතාගේ සංවිධානයෙන් NDB බැංකුව අනුග්‍රහයෙන් මෙම අධ්‍යාපන සත්කාරය ක්‍රියාත්මක විය.

පරිසර විද්‍යාඥ මහාචාර්ය සරත් කොටගම මහතා පුරා දින තුනම දරුවන් සමඟ ක්‍රියාකාරීව ප්‍රධාන උපදේශක ලෙස සහභාගී වීම විශේෂයෙන් සඳහන් කරන්නේ ඉතාමත් ගෞරවයෙනි.

පාසල තුළ වැඩසටහන සංවිධානය කිරීම සඳහා ජී.ඒ.ඒ.පී. ගනේපොල ගුරු මහතා ක්‍රියාත්මක වූ අතර අ.පො.ස. උසස් පෙළ හදාරන ශිෂ්‍යාවන් 20 දෙනෙකු මේ සඳහා ඉදිරිපත් වූහ. දියණියන් වෙනුවෙන් නාලිකා ජයමහ ගුරුතුමියත්, ආර්. රංජනී ගුරුතුමියත් ස්ව කැමැත්තෙන් එක් වූහ.

පිවිසුම වෙත පැමිණි පසු මුලින්ම වැසි වනාන්තරයක දේශගුණික ලක්ෂණ, ශාක ස්ථරීභවනය, පත්‍ර, කඳ, මුල් ආදී කොටස්වල සුවිශේෂී ලක්ෂණ හා මඟ දෙපස ඇති දිය ඇලි ශාක පිළිබඳ හැඳින්වීමක් ලබා ගතිමු.

සීතල ජලය ඇති දිය පහරක පහස විඳිමින් ඉන් එතෙරව අපේ නවාතැන වෙත ළඟාවන විට පෙ.ව. 12.30 පමණ විය. වනාත්රය තුළට පිවිසීම සඳහා අනුමත ඇඳුම් කට්ටලයේ පක්ෂීන්ගේ නම් ගසාගත් අප කුඩා කණ්ඩායම්වලට බෙදී දන හිස තෙක් සපත්තු දාගත්තේ උජාරුවෙනි. මඳ වැසි පොදක් එවේලෙහි පැවැතියද එය එම වනාන්තරයේ ස්වභාවයයි.

ශාක පත්‍රවලින් උත්ස්වේදනය මගින් ජලය පිටවීමත් නිතරම පරිසරයේ ආර්ද්‍රතාව වැඩි වීමත් අඳුරු වලාකුළින් බරව තිබීමත් නිතර මඳ වැසි ලැබීමට හේතු විය හැකිය. එහෙත් අපේ කටයුතුවලට වැස්ස බාධාවක් නොවීය.

සීලෝමය නැමති දේහ කුහරය මුලින්ම විකසනය වූ සත්ව වංශයට අයත් සඛණ්ඩ පනුවන් වන කූඩැල්ලා සිටියත් හානියක් නොවූයේ අපි ඒ සඳහා සූදානම්ව සිටි බැවිනි. මුලින්ම කූඩැල්ලෙකු සපත්තුවේ සිටිනු දැක කෑගැසූ දියණියක එදින සවස් වන විට අනෙක් අයගේ සපත්තු වල සිටින කූඩැල්ලන් අල්ලා ඉවත් කිරීමට තරම් නිර්භීත වීම සුවිශේෂ මතක සටහනකි. එහිදී අප හා එක්වූ මග පෙන්වන්නන්ගේ අනු දැනුමෙන් වනාන්තරයේ මෑත සීමාව හා ඉන් පිටත අතර වෙනස පැහැදිලිව නිරීක්ෂණය කළ හැකි විය. කිසිම කාලවකවානුවක තුනී ලෑලි සංස්ථාවට ශාක ඉවත් කරගත් ආකාරයත් ඒ කාලයේ තිබූ මාර්ග පිළිබඳවත් එම ප්‍රදේශයේ නැවත වනය ඇතිවූ ආකාරයත් කරුණු සහිතව පැහැදිලි කරගන්නා ලදි. ඒ ඒ ස්ථානවල PH අගය, පසෙහි ඇති ඛනිජ හා කාබනික කොටස් පිළිබඳව, විශාල ගස් නොවැටී තිබීමට කයිරුමුල් ආකාරයේ මුල ආධාරක ඇතිවීම, යම් ස්ථානයක ගහන ඝනත්වය සෙවීම, පත්‍රවල ඇති සුවිශේෂී ලක්ෂණ හා අනුවර්තන, සමනලයින්, දළඹුවන්, ශාක කඳට පිටින් පිහිටි කොපුවක කුහුඹුවන් ජීවත්වන ශාක බාඳුරා කෙන්ඩියේ උදේ, දවල් PH අගය වෙනස් වීම, පියන විවෘත වීමට ප්‍රථම එහි ඇති දියරය ඖෂධ ලෙස යොදාගැනීම, කැන්ද කොළයේ මැද ඇස් දෙකක් හා නාසයක් වැනි පිහිටීම, සමහර පත්‍රමත ලයිකන සෑදීම, ගෙරි නැමති කුහුඹුවන් වර්ගයක් ගස් උඩ සාදන ලද කූඩුවෙහි පසු කලෙක කොඩයි කෑරලා සහ ජීවන සම්බන්ධතාවට උදාහරණ ලෙස බිත්තර දැමීම, වනාන්තරයකට පෙහොර දැමීමට අවශ්‍ය නොවන්නේ ඇයිද යන බව දැනගත් හා සොයා බැලූ කරුණු කීපයක් විය.

සවස 5.30 ට පමණ නවාතැනට පැමිණි පසු නැවත 6.30 ට දිනයේ වැඩකටයුතු පිළිබඳ සමාලෝචන හා පරිසර විද්‍යාව, ශාක හා සතුන් පිළිබඳ කරුණු, පරිසර දූෂණය, පොලිතීන්, වනාන්තර වල ආරක්ෂාව, පිළිබඳ ගැඹුරු දේශන වලට සවන් දෙන්නට යොමුවන්නේ මහාචාර්ය සරත් කොටගම මහතාගේ හා අරුණ පත්මපෙරුම මහතාගේ මග පෙන්වීමෙනි.

පසුදා උදෑසන අවදි වන දරුවන් සූදානම් වී ගමන් ආරම්භ කළේ මුලාවැල්ලට යන්නටය. කිලෝමීටර් දෙකක් පමණ කන්දක යන්නට ඕනෑ, දුෂ්කර මාර්ගයකි එය. කැලෑව නිරීක්ෂණය කරන්නට නම් කුඩා කණ්ඩායම් සෑදී නිශ්ශබ්දව ගමන් කළ යුතුයි. එවිට කැලෑව කැමතිය. එහෙම කිව්වේ අරුණ පත්ම පෙරුම මහතාය. ''කොළ පැහැයට හුරු ඇඳුම් අඳින්න ඕන. එවිට කුරුල්ලන් මෙන්ම අනෙකුත් සතුන්ද දැකිය හැකියි. කොළ පැහැයට හුරු ගොලු බෙල්ලන්, පලාපොළඟුන් කොල පැහැවේගෙන එන කූඩැල්ලන් පරිසරයට අනුවර්තනය වෙලා. අපිත් පරිසරයට අනුවර්තනය වෙන්න ඕන.'' ඒ අපට ලැබුණු උපදෙස්ය.

විවිධ වර්ගයේ කුරුල්ලන්ගේ හඬ එක්වරම ඇසෙන්න පටන් ගත්තේය. විමසිල්ලෙන් බැලූ විට කුරුලු වර්ග 15ක් පමණ එකට ගමන් කරනවා දුටුවෙමු. ''ඒකට කියන්නේ කුරුලු නඩය කියල. විවිධ වයස් ප්‍රමාණයේ විවිධ අරමුණු ඇති අය, දිවා කාලයේදී ආහාර සොයා යාමට සමගි වෙලා. හරියට සිරිපාදේ යන නඩයක් වගේ.''

''නඩයේ ඉදිරියෙන්ම යන්නේ කවුඩා, එයා තමයි මඟපෙන්වන්නා. කුරුලු ආරක්ෂකයා, අනතුරු හඟවන්නා, ඉදිරියෙන් යන නිසා කෑම හොයන්න වෙලාවක් නෑ. අනෙක් අයගෙන් වැටෙන කෑම හෝ උදුරාගෙන කෑම ගෙන අනෙක් අයට මෙහෙවර කරනවා.''

ගස් අතරින් කඳු පල්ලම් තරණය කරමින් ක්‍රමක්‍රමයෙන් අපි මුලාවැල්ලට නැග්ගෙමු. සිතට දැනෙන සුවය සුළඟ සමඟ මසුවෙයි, මහන්සිය නැතිව ගියේය. අවට පරිසරය ඈතට ඉතාම අලංකාර ලෙස පෙනෙයි. සිත්ගන්නා සුලු දර්ශනයකි. එදා සවස වැඩ සටහනට දරුවන්ට පැවරුම්, ප්‍රශ්න පිළිතුරු, චාරිකා පිළිබඳ සටහන්, චිත්‍ර වැඩ ගොඩයි. ඔවුන් සහභාගී වූයේ නිදිමතක්වත්, කම්මැලිකමක්වත්, මහන්සියක්වත්, නොමැතිව ඉතා ක්‍රියාශීලී ලෙසයි. පින්තූර කැපීම්, පොත් හැදීම්, හොඳ හොඳ පැවරුම් නිර්මාණය විය. ගුරුමහත්මීන් දෙපළ ඒ අසලින්ම සිටියහ. හැමෝම සතුටුවූහ. ඊට පසුදින යෝද නවද ගස, විශාල පුස් වැල, අපිශාක ලෙස වැඩෙන ඕකිඩ්වර්ග, දිය ඇලිවල සිටින ට්‍රවුට් මත්සයින්, වේවැල්, ගිනිහොට, කැළෑමකුළුවන් ඒ වගේම සිංහරාජ තොරතුරු මධ්‍යස්ථානය, සන්නිවේදන මධ්‍යස්ථානය නැරඹීමට අවස්ථාව ලබා ගත්තෙමු.

නවාතැන පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතුයි. එම ස්ථානය භාරව සිටියේ මාටින් විජේසිංහ මහත්මාය. එතුමා අවුරුදු 30ක් පමණ වනාන්තරයේ සිටි වනාන්තරයට ආදරය කරන වනාන්තරය ගැන හොඳින් දන්නා, ගහකොළ ගැන ප්‍රායෝගික දැනුම ඇති අයෙක් විය. අපි හැමෝටම හොඳ අත්දැකීමක් ලැබිණ. ජීවිතයට අත්වැලක් සමඟ පරිසරය හා ජෛව විවිධත්වය සුරකින අත්දැකීම් බෙදාහදාගන්න දරුවන් පිරිසක් බිහිවූහ.

හැම දෙනාටම බොහොමත්ම ස්තූතියි.

**රොබට් එම්. එදිරිසූරිය මයා**
**අ.පො.ස. (සා/පෙළ) විද්‍යා ගුරුතුමා**

# සිත් රූ



යසිනි චාතුර්යා - 7 - F



එච්.ඒ. හිමහංසි - 6 - F



ඒ. පුනාරා විදුසිනි - 8 - F



ජනනි භාග්‍යා - 6 - F



කේ.ඒ. ටෙනුරි යුමන්සා - 8 - E



ජනුදි ඔනෙත්රා - 6 - A



හෙෂානි නවෝද්‍යා - 7 - A



පබා පත්මපානි 8 - G



වෙනුම් මනීෂා - 8 - F



තරුපබා වීරවර්ධන - 8 - B



චමෝදි පියුමන්ති - 7 - F




උමේෂා දිලාංජලී
6 - B



අමාෂා ඉමන්දි
8 - G



ෂයානි උත්තරා
8 - F



අයමි සංසිලුනි
7 - A

මැණික දිලෙන්නේ 'කැපෙනා' තරමට වන අතර කඩුව කැපෙන්නේ 'තැලෙනා' තරමටය.

# සිංහරාජයේ වගතුග පිටුවෙන්.....





මහාචාර්ය සරත් කොටගම මහතා කරුණු දක්වමින්



කැන්ද කොලේ විශේෂත්වය



රාත්‍රී නවාතැනේදී දේශන



සූදානම් වූ පිරිස



පත්‍රය මත සෑදුණු විවිධ ලයිකන



ගිනි හොට



බාඳුරා කෙණ්ඩිය තුළ ඇති දේ



සිසිල් දිය පොදක පහස විඳිමින්



මුලාවැල්ලට ගිය අපි



මුලාවැල්ල මුදුනේ සිට අවට පෙනෙන අයුරු



බාඳුරා මල්



මනා දිය පහරක්



මාටින් විජේසිංහ මහතා, මහාචාර්ය සරත් කොටගම
NDB බැංකුවේ නිලධාරී මහතා ඇතුළු පිරිස



යෝධ පුස්වැලක්




පියන විවෘත වූ සහ නොවූ බාඳුරා කෙණ්ඩියක්



ශාක මත සාදන ලද ගෙරි කුඹි කූඩයක්



යෝධ නවද ගස



# පණිහිඳ

## විහඟ ගීතය



සැමදා හිමිදිරියේ මට ඇසෙනා
ඈත ඉමේ වෙල්යාය සිසාරා
රංචුගැසී එක පෙළටම ගයනා
ඔවුනට ගී මඩලකි මෙය අගනා

සරබර ගා වැනෙනා අර තුරුලී
සපයයි වැයුමක් අගනා පරිදී
මඳ පවනින් නටනා දළු රිකිලී
පෙන්වයි නැටුමක් ගීයට රසිනී

විහඟුන්ගේ ඒ රාවය නන්දන
පිනවයි සවනොත් ගීරස කැන්දන
දන්වයි ලොවටම මිහිරෙන් මිහිරට
හිරු කුමරිය සබයට වඩිනා බව

රන්වන් පාටින් බබළන හිරු රැස්
ගීයෙන් ගීයට එක්වන අරුණැස්
පෙන්වයි එකටම තම තම දස්කම්
පුදුමයි හිමිදිරි ගීයක විස්සම්

නොකරම එකටම ගීයේ අවසන
ටිකටික නවතයි රාවය එක එක
තාල තබා ගැයූ හිමිදිරි ගීතය
නිසා තමයි කෙරුණේ දින ඇරඹුම

වැයුමට එක් කළ ගැයුමත් අගනා
ගැයුමට එක් කළ වැයුමත් අගනා
දෙකටම එක් කළ රැඟුමත් අගනා
විහඟ ගැයුම් දැක්වූ සැටි සොබනා

**එස්. දෙව්මිණි නිලක්ෂි**
10 - F

## මා ලොව හිරු සඳු

දස මස මා ඔබේ කුස තුළ දරාලා
ලේ කිරි කරල මා හට නුඹ පොවාලා
රසහර උයා මා හට නුඹ කවාලා
හොඳ දේ කියා දුන්නා නොම තලාලා

දහඩිය මහන්සිය ගැන නොම සිතාලා
අපට කියා මුදල් හදල් සොයාලා
රෑට ඇවිත් මා උකුලේ තියාලා
නළවයි මාව රසබර කවි කියාලා

අප වෙනුවෙන් සදා වෙහෙසෙන්නේ නිබඳ
පෙන්වන්නෙමි හැකි තරම් ප්‍රතිඵල නොමඳ
හැමදා රැකබලා ගන්නෙමි පෙමින් බැඳ
සදා මගේ ලොව හිරු සඳු ඔබ නිබඳ



විහංගා හරින්ද්‍ර
7 - D



## ඉපදෙන්න යළි මගේ මව වී

ඔබේ රුව මතුවෙයි වෙයි කියා
බලා උන්නෙමි රෑ දිවා
දෑස් තෙත් වෙයි
යළි වියළෙයි
කඳුළු කැට දෙකොපුල් පුරා

රැය ගෙවී හිරු දවස අරඹයි
නමුත් ඔබ නෑ පැමිණියේ
යළි යළිත් දින සති ගෙවී යයි
නැහැනෙ ඔබෙ රුව මතුවුණේ

බහ තේරෙන විට ඔබ පමණයි මට
සිටියේ මගෙ තනි නොතනියට
දුකට සතුටට සැමට එකලෙස
සදා සිටියා මා ළඟින්

නමුත් අද මම දුකින් වැළපෙමි
නැතේ ඔබ දැන් මා ළඟින්
මා හඬනා විට තුරුළට ගත් ඔබ
නිහඬ වී සැතපී සිටියි

ඔබේ මතකය මසිත හඬවයි
නමුත් මතකය සුන්දරයි
මා තනිකර ඔබ යන්න ගියේ ඇයි
වුණාදෝ වරදක් මගෙන්

මවක් නැති මට මවක් වූවා
පියෙක් නැති මට පියෙක් වූවා
ලේවලින් අප බැඳී නැති මුත්
බැඳී ඇත අප හදවතින්

වැදූ මව මගෙ නොවූව ද ඔබ
සෙනේ ගඟුලේ නිමක් නෑමයි
හැදූ මව මගෙ නොවේ ඔබ මගෙ
සැබෑ මව ලෙස මට හැඟෙයි

තෙරක් නොපෙනෙන ඔබේ ගුණකඳ
තෙරක් නැති අහසට සමයි
වෙනද ඔබ මට කවන බත් පත
ශීත වී ඇත ඔබ ලෙසින්

පාළුව තනිකම බිය සේදී යයි
හළනා කඳුළට ඔබේ නමින්
කිසිදු කඳුළක් නොදුන් ඔබ අද
සිත ද පාරා දෙනෙත තෙමවයි

සෑම දිනකම දොර ඇරී ඇත
යළිත් ඔබ පැමිණෙයි කියා
නමුත් වටහේ සියලු දේ මට
ඔබත් මට අහිමිව ගියා

මතු මා උපදින ආත්මයක දී
ඔබේම දුව වී ඔබේ කුසේ
උපදින්ට මම හදවතින්
පතන්නෙමි දැන් සැම දිනේ

**ඩී.එම්.බී. සශිකා දෙව්මිණි බණ්ඩාර**
9 - G

## තාත්තේ.....



මගේ හද පුදසුනේ
දෙවියෙකු වීනම්
මා අයදින.....
මගේ හිත් මායිමේ
මිනිසෙකු වීනම්
නිබඳ මා සුරකින
ඒ ඔබම විය හැමදින
දයා ගුණ කරුණාව
අප හැමට බෙදා දී
ඔවා ගුණ මිණි ලෙසින්
නිබඳවම ලබා දී.....
පිය නගන මාවතේ
හිරු සේ ම සඳු සේ ම
ඔබම පමණයි ඉතින්
මගෙ ලොවේ වැජඹෙන්නෙ

**තරුෂි පූර්ණිමා**
13 - K

## පොසොන් උත්සවය



දුනු ඊතල අතේ දරා
පිරිවර සමඟින් නිරිඳුන්
වනය තුළට ඇතුළු වුණේ
පොසොන් පෝය දා....
මුව පොව්වෙකු දුටු නිරිඳුන්
මානා ගෙන දුන්න අතින්
කැලය තුළට දුවන් ගියේ
පොසොන් පෝය දා...
පිරිවර මඟ හැරුණ රජුට
උස් පර්වතයේ මුදුනින්
තිස්ස තිස්ස හඬ නැඟුණේ
පොසොන් පෝය දා...
දුනු ඊතල බිම වැටුණේ
සාදු කියා හඬ නැඟුණේ
තුන් රුවනින් සැණසුණේ
පොසොන් පෝය දා....

**සත්‍යා දෙව්මිණි**
7 - D

## ඇඳ මට.....



වර්ණයක් නොදුටුවද,
සුවඳින්
නුඹ කුසුමක් බව හැඟෙනවා...
කොළ අතු නටන බව නොදුටුවද,
සිසිලසින්
නුඹ පවනක් බව හැඟෙනවා....
රඹ පැහැය නොදුටුවද,
උණුසුමින්
නුඹ සූරිය මල බව හැඟෙනවා....
සොඳුරු දසුන් නොදකින
අඳ මට....
හැම දහවලක්ම රාත්‍රියක් සේ හැඟෙනවා....

**අයෝධ්‍යා යොමාලි කරුණානායක**
13 - M කලා

11 පිටුවට

ඔබේ ජයග්‍රහණයේ නිර්මාතෘවරයා ඔබමය.

10 පිටුවෙන්

# IMPORTANCE OF TREES



Trees are life blood of us. They help us in different ways. We get water, oxygenated air, shelter, food from the trees. Trees create a beautiful surrounding around us. If the trees are not available, we can't have a healthy environment. This is a gift of the mother earth to her children. And as I think, a friend, a lovely friend is given to us by mother earth. So we should protect this gift.

But at present trees being destroyed rapidly due to many reasons. Some of them are deforestation, development activities and so on and also trees protect us from natural disasters too. If you cut a tree, plant another tree. While giving this message, again I remember protect this nature.

**Tanuri Monija - Grade 7 - D**

# පුදසුන අබියස

එකෙක්
ප්‍රේමයෙන් මුසපත්ව සතුටු වන විට,
තවකෙක්,
ප්‍රේමයේ විරහව දැක කඳුළු හෙළයි
ඒ කිසිවක් අත්නොදුටු මම,
ප්‍රේමය යනු කුමක්දැ'යි
මාගෙන්ම විමසුවෙමි
ඉන් කිසිදු පිළිතුරක් නොලද මා...
ප්‍රේමයේ මල් කිනිති,
සරසවි පුදසුන මත
පුද කොට,
බලා හිඳින්නෙමි......

ඒ. ස්වප්නා දිව්‍යාංජලී
**13 - M**

# ආදරයට එහා ගිය සෙනෙහස

නිලඹරේ හැංගී
ලොවම සනසන
නියාවෙන්
රැකගත්ත සත්තකින්
මගේ ජීවය
ඔබ එදා සිට....
රුහිරු කිරි කර
ලබා දී නුඹ
නිදිවරා වෙහෙසුණා
රැකගන්න මා....
නෙතට නිවනක්
ගතට නිවනක්
නැති වුණත් ඔබ
සැනසුණා සත්තයි
මා දෙස බලා....
ඔබගෙ දෙනෙතට
කඳුළු
දෙන්නට අවැසි
නැත මට....
ඔබ එදා මා
රැකගත් ලෙසින්
රැක ගනිමි මා සෙනෙහසින්.....

හංසනී පියුමිකා
**13 - L** (කලා අංශය)

# උදෑසන



නඟයි කවියෙකු කවට
උලුප්පා උදයක මිහිර....
දිනපති බැබළි නුඹ මත
ප්‍රභාවෙන් සතපා ධරණිය
හඟවයි අවදිවිය යුතු බව

එපමණම කවියෙකුට
සොඳුරුයි උදය වැණුමට
නමුදු ඒ සොඳුරු බව මත
අන්ධයෙකු වෙයි මා සිත
මට හැඟෙනුයේ දිනපති අවුත්
කොඳුරයි මගේ සවනතට,

"අවදි වනු වහ වහා
යුධ වදිනු අලසය
නැවත පණ ලත් දිනය ගෙවනට"

මෙවන් බස් කොඳුරන
පසමිතුරු උදෑසන
සොඳුරු වෙයි තිරසරව
සිහිවිකල් වූ කවි සිතට

එච්.ආර්. නවින්ද්‍යා කාවින්දි
**13 - M**

# යශෝදරාවිය

හෑද යහනේ සැතපවූ
හේළි ප්‍රාර්ථනාවෝ....
පුපුරුවා හැරිය ඒ
ආදර ලෝහිත දියර...
සොඳුරු හී තුඩ නිතියෙන්
මනයොන වුවද සතු
නිහඬ විය හී තුඩක් අභියස නපුරු
නමුදු පතිනියකගේ පතිහරට
පවන්මඟ විය කම්පිත
ගැහුණි ඒ හදවත නැවත....
ආදර රුධිරයේ මහිමයෙන්
දිවි භාරදුන් සදාතන
ප්‍රේමයේ නාමයෙන්....
සසර නම් ජලනිධිය සිසාරා
භාවාන්තරණයක් කළා සේ ඉකුත්සයුරු
දෙහදක් පියමං කළා
කින්නරාවියකගේ පරිත්‍යාගයන් අතරින්
අරිඅටඟි මඟ වෙතට.....
සසර බන්ධන නිම කළා ඔහු
වෙනුවෙන් පුහු ජීවිත
යශෝදරාවිය විය සැමදා
නොලැබුණත් ඒ පුරුදු සෙනෙහස....
නාකොටික් සිහිනවල
සමාජජාලා පවන්මංවල
විටෙක වැටකෙයි ගහන පිරික්සන
පෘතග්ජන අශික්ෂිත ආදරය
සමකරනු කෙලෙසද
චන්නකින්නරාවිය වූ යශෝදරාවගේ ප්‍රේමයට...
ප්‍රයත්නයක් යම් වේද,
එයයි යශෝදරාවියක
වීම ම මහිලාවක්......

කේ.කේ. සියුමි කීරවැල්ල
**13 - K**

# අහස

උදෑසනින් හිරු කුමරා අහසට එනවා
නීල වර්ණ අහස් කුසම එළිය කරනවා
ශ්වේත වලාකුළු අහසේ ගමන් කරනවා
අහස් ගැබේ විවිධ විවිධ රූප මැවෙනවා

සවස් වරුවෙ හිරු කුමරා බැසගෙන යනවා
මුළු අහසම රන් පාටින් එළිය කරනවා
ශ්වේත වලා නොයෙක් වර්ණවලින් දිලෙනවා
විසිතුරු සිතුවමක් ලෙසින් අහස පෙනෙනවා

රාත්‍රියෙදි සඳ කුමරිය අහසෙ දිලෙනවා
නිල් පලසක ඇති මුතු ලෙස තරු දිලිසෙනවා
සඳ කුමරිය රිදී පැහැති රැස් විහිදනවා
ගඟදිය මත රැස් වැටිලා රටා මැවෙනවා

රවීෂා සසින්දි
10 - F

12 පිටුවට

අකුරට ඔබ වන්න දාස, අකුරු ඔබට වේය දාස.

11 පිටුවෙන්

# මොහොතක් සිතන්න

හොඳ මිතුරා තමයි දවසක පර සතුරා
හොඳ නම නැති කරයි බොරු හැම තැන පතුරා
එකටෙක නොගොස් හැම විට සෙත් කව් මතුරා
අදහන දහම දිවියට කරගමු සපුරා

ගලන ගඟ හැඩයි ගල් පරවලට වැදී
පහළට ගලන්නේ සුදු පෙණ බුබුළු බිඳී
වැදෙනා විට පහර ජලයේ රිදුම් දිදී
ගල් කැට මටසිලුටු වීලා බලා හිඳී

හැරම්ටියේ සහය ලැබ කඳු නැග ගත්තේ
නැගගත් පසුව එහි වටිනාකම නැත්තේ
මෙහෙමයි සමාජයෙ අද පවතින තත්තේ
මේ බව සැවොම මැනවින් දැන ගත යුත්තේ

කනවිට අතිරසත් රස නැති වෙනවාලු
කළ කී සියලු හොඳ අමතක වෙනවාලු
කලකදී වහලු කලකදී රස වෙනවාලු
ලෝ දහමට අනුව දුක් සැප එනවාලු

ගවයා කරත්තය ඇදගෙන දුවන ලෙද
කළ පව් තමන් පසුපස එයි දෙමින වද
පසු පස එන විටදී අපි හැම කරපු හොඳ
කිත් පැසසුම් ලබා බබළෙයි වගේ සඳ

නොවෙනස් වන කිසිත් නැත ලොව වෙනස් වන
එනිසා මිනිස් සිත ගැන වෙන කතා මොන
වෙනසට බිය නොවී ඉදිරිය වෙතම යන
සතුටින් දිවි ගෙවන්නේ ලොව එවැනි දන

පල නොකියා බෙදන විටදී පිසූ පළා
සිටිනු හොඳයි එවිටකදී අහක බලා
දමනා විටදී අනෙකුන් ඔබ තලා පෙළා
නොදොඩා හිඳීමයි හොඳ මුව සිනා සලා

දිලිසෙන සියල්ලම දඹ රත්තරන් නොවේ
හැම මිනිසා තුළම හොඳ සහ නොහොඳ මැවේ
පව් වැඩ කළෝතින් උන් මතු නිරයෙ දැවේ
සරණක් නොමැත ඉපදුණොතින් බවෙන් බවේ

**චම්පා රණබාහු මිය**

# ඇතුම...

අඳුරු වලාකුළු රැසක් අතරේ
මගේ දිවියට ආලෝකයක් වන්නට
නිතැතින්ම මා ළඟ සිටින්නේ
ඔබ දෙපළ පමණකි සැමවිටම.....

සතුට පමණක් නොව දුකේදී
මගේ කඳුළුත් ඔබේ කරගෙන
හදවතේ දෝරෙ ගලනා සෙනෙහසින්
සැනසෙව්වෙ ඔබ පමණමය අම්මේ හදවතින්.....

හොඳ නරක සැම විටම පෙන්නා
කෙලෙසක හෝ අනාගතයේ එක් දිනක
රටට බර නැති දැයට වැඩ ඇති
දියණියක වන්නට පැතුවේ ඔබ පමණමය තාත්තේ හදවතින්.....

දිනක් පැමිණෙයි අනාගතයේ යම් තැනක
මගේ සිහිනය එල දරන්නට
කෙලෙසක හෝ එක් කරමි ඔබේ දෙනෙතට
තුටු කඳුළු බිඳ සරසවි සිසුවියක ලෙස මම....

සෙනිති දිසංසා
10 - D

# අම්මා



දුටිම් අගනක්
සියල්ලෙන් සපිරි නමුත් ගැරහුම් ලබන
නොරිද්දන රෝස පැළයකි අෑ
කපා හෙළුවද නැවත දලු ලන
දිදුලා අඳුර නිවාලන නමුදු
ශෝක ගී අතරෙම ක්ෂයව වියැකී යන
එබැවින් පසක් කර ගතිමි
රැස්හිමි පරදා තරුපති ආලේ ලබන බව

සනීෂා මිදෝරි
12 - L (කලා අංශය)

# සැඳෑ අහස



රත්පැහැයෙන් දිලෙනා නෙක වර්ණ පිරුණු බේසමක්
හැලිලා අහසේ ඇඳිලා පුංචිම හැඩ සිතුවමක්
කහ පැහැයෙන් ඒ චිත්‍රෙට පුංචි කැටයමක්
තැබුවා හෙමිහිට ලස්සන පුංචිම පොඩි රාමුවක්

රාමුවකට කොටුවුණු ඒ ලස්සන අර්ථයේ
සැබෑ අරුත කුමක් වේද ලියා තිබෙන පන්හිදේ
අහසේ විස්කම් මවනා හිරු සඳු පෙළ එක සැරේ
කියා දුන්නේ අරගලයට සාමයෙ සිරි පාඩමේ

අහසේ විස්කම් මවනා සුන්දර මේ සාදයේ
පාට එකට එක්රොක් වුණු අලංකාර සිතුවමේ
ජීවමාන චරිත දෙකකි හිරු සඳු මේ මවන්නේ
කෙලෙස ලියන්නද අසිරිය සැඳෑ අහසේ මේ දිනේ

දිනිති තාරුකා කරුණාරත්න
12 - A (කලා අංශය)

# හිරු



- හිරු ලොකු තරුවකි.
- හිරු නැගෙනහිර අහසින් පායා බස්නාහිර අහසින් බැස යයි.
- සූර්යයා, ඉර, රවි වැනි නම්වලින්ද හිරු හඳුන්වනු ලැබේ.
- අපට එළිය හා උණුසුම ලබා දෙන්නේ හිරුය.

සනුති සහන්මා
2 - A

# විද්‍යාප්‍රබන්ධය

## සිහිනය



"සුබ උදෑසනක්! කාල්, අද ඔයා වෙනදට වඩා කලින්ම යන්නද හදන්නේ?"

කාර්යාල ඇඳුමින් සැරසී තරප්පු පෙළ බසින සිය සැමියා දෙස බලමින් ලිලී විමසුවාය.

"සුබ උදෑසනක් ලිලී! වැදගත් වාර්තා ටිකක් තියනවා බලන්න. ඒකයි කලින්ම යන්නේ...."

කාල් මැකාති හා ලිලී මැකාති යුවල වාසය කළ ජනාවාසය අඟහරු ලොව දෙවන කලාපයේ පිහිටා තිබුණි. ප්‍රකට ජාන විද්‍යාඥයෙකු වූ කාල් මේ දිනවල ඔහුගේ පර්යේෂණය සමඟ බෙහෙවින් කාර්යබහුලව සිටියේය.

"ඒ කියන්නේ පර්යේෂණය සාර්ථකත්වයක් පෙන්වනවාද?" උදෑසන ආහාර ගනිමින් ලිලී කාල්ගෙන් විමසුවාය. "හ්ම්.... තාම නම් නෑ ලිලී. අපි බලමුකෝ....."

කාල් තෙවසරක් පුරා උත්සාහ කරමින් සිටියේ අඟහරුගේ පරිසරයට ඔරොත්තුදෙන ශාක විශේෂයක් සොයාගැනීමටයි. ඔහුගේ උත්සාහය සිය විද්‍යාඥ මිතුරන් අතර රසවත් විහිළුවක් බවට පත්ව තිබුණි. කළ නොහැකි දේට කාලය වැය කරනවාට වඩා ප්‍රයෝජනවත් යමකට කාලය වැය කිරීම වටිනා බව ඔවුන්ගේ අදහස විය. නමුත් ඒ කිසිවකින් නොසැලුණු කාල් සිය අරමුණ වෙනුවෙන් බොහෝ වෙහෙස විය. ඔහුට ශක්තියක් වූයේ ලිලී, සිය දියණිය සාරා හා සිය සහායකයා වූ එඩ්වඩ්ය.

කාල් විද්‍යාගාරය වෙත ළඟාවන විට එඩ්වඩ් පැමිණ නොසිටියෙන් ඔහු තනිවම සිය පරීක්ෂණ වාර්තා විශ්ලේෂණය කරන්නට වූයේය. සිය පර්යේෂණය සාර්ථක වුවහොත් ඔවුන් ජීවත් වූ අඟහරු ලොව ඒකාකාරී රතු පැහැයෙන් මිදී සුන්දර හරිත වර්ණයෙන් දීප්තිමත් වනු ඇති බව ඔහුට ප්‍රත්‍යක්ෂ විය. එමෙන්ම එය අඟහරු මත ආහාර නිෂ්පාදනයේ නව පෙරළියක් ඇතිකරනු ඇති බව ඔහුගේ විශ්වාසය විය.

නව ප්‍රතිකාර කිහිපයක් අත්හදා බැලීමේ අරමුණින් පිළියෙළ කළ කදා කිහිපයක් අන්වීක්ෂයට නැංවූ කාල් ඒවා නිරීක්ෂණය කරන්නට වූයේය. "සුබ උදෑසනක් සර් අද කලින්ම වගේ" සිය පරීක්ෂණය තුළ නිමග්න වී සිටි කාල් එඩ්වඩ්ගේ හඬින් තිගැස්සුණි. "සුබ උදෑසනක්! එඩ්වඩ්. මම මේ වැඩ පටන්ගත්තා විතරයි." එඩ්වඩ් ද කාල් අසලින් අසුන්ගත්තේ සිය ආචාර්යවරයාට හවුල්වීම සඳහාය.

"ඕහෝ.... කාල්, සුබ උදෑසනක්" ආචාර්ය තෝමස්ගේ ආගමනයත් සමඟ කාල් හා එඩ්වඩ් විස්මයට පත්වූහ. "ආ... තෝමස්, මොකද මේ පැත්තේ..? කාල් එසේ විමසමින් එඩ්වඩ් දෙසට නෙත් හෙළීය. එඩ්වඩ්ගේ දෑස් තුළ ද වූයේ ප්‍රශ්නාර්ථයකි.

ආචාර්ය තෝමස් කාල්ගේ පර්යේෂණ නිතර සරදමට බඳුන් කළ අයෙක් විය. ඔහු කාල්ගේ දක්ෂතාවන්ට දැඩිව ඊර්ෂයා කළ අයෙකු බව සියල්ලෝ දන සිටියහ. මිතුරන් අතරේදී කාල්ගේ පර්යේෂණයට විරුද්ධව අදහස් ප්‍රකාශ කිරීමටද ඔහු පෙළඹී තිබුණි. මින් පෙර කාල්ගේ විද්‍යාගාරයට ආචාර්ය තෝමස් පැමිණ තිබුණේ කිහිපවරකි. එබැවින් මෙවර ඔහු උදෑසනින්ම පැමිණීම විස්මයට හේතු විය.

"නිකන්.... නිකන්.... කාල්, ඉතින් කොහොමද වැඩ කටයුතු?"

"හොඳින් කෙරීගෙන යනවා තෝමස්"

"කාල් අමතක කරන්න එපා... මේ සතියේ විද්‍යාඥයින්ගේ හමුවක් තියනවා..."

තෝමස්ගේ හඬෙහි ගැබ්වී තිබුණේ අවඥාවයි. "හරි, හරි මට මතකයි තෝමස්"

"එහෙනම් මං යන්නම් කාල්. ඔයාලා හොඳින් වැඩකරගෙන යන්නකෝ...." කාල්ගේ නිහඬබව මධ්‍යයේම තෝමස් පිටව ගියේය. කාල් පිටව යන තෝමස් දෙස බලා සිටියේය. මෙවර විද්‍යාඥ හමුවේදී තෝමස් කවරක් හෝ සිදුකරනු ඇතිබවට සැකයක් කාල්ගේ සිතේ ඉපදිණි.

තෙදිනකට පසු කාල් වාර්ෂික විද්‍යාඥ හමුවේදී සිය මිතරන් සමඟ සතුටු සාමීචියේ යෙදී සිටියේය. එනමුදු ඔහුගේ සිත ආචාර්ය තෝමස් පිළිබඳ දෙගිඩියාවෙන් පිරී තිබුණි. සාකච්ඡා හා දේශනා අවසානයේදී එළඹුණේ යෝජනා හා චෝදනා වාරයයි.

"ආචාර්ය කාල් මැකානි" විද්‍යාඥ සංසද සභාපතිතුමා සිය නම ඇමතීමත් සමඟ කාල් තම අසුනින් නැගී සිටියේය. "ආචාර්ය කාල්, අපිට ඔබ ගැන චෝදනාවක් තියෙනවා" සභාපතිතුමාගේ හඬ රැව්දෙන්නට විය. "ඔබතුමාගේ පර්යේෂණය අභව්‍ය බවත්, එමඟින් විද්‍යා ලෝකයට අපහාසයක් වෙන බවත් තමයි මේ චෝදනාවේ සඳහන් වෙන්නේ. අපි කැමතියි මේ පිළිබඳ ඔබේ අදහස් දැනගන්න."

කාල්ගේ හදවත වේදනාවෙන් පිරී ගියේය. ඔහු අපහසුවෙන් සිය හඬ අවදිකළේය. "ගරු සභාපතිතුමනි, මගේ පර්යේෂණය අභව්‍ය නොවන බව මම මුලින්ම කියන්න කැමතියි. ඒ වගේම අපි අද වන විට ලබාගෙන ඇති බොහෝ දේවල් අභව්‍ය බව සලකපු කාලයක් තිබූ බව හැමෝම දන්නවා. අතීත විද්‍යාඥයොත් ඒ දේවල් අභව්‍ය යැයි අතහැර දැම්මා නම් අද ඔබත් මමත් අඟහරු ලොව මේ විදිහට ජීවත් වෙන්නේ නැහැ. ඒ නිසා කරුණාකර ඒ පිළිබඳවත් සලකා බලන්න"

"ආචාරය කාල් ඔබ කියන දේ අපිට වැටහෙනවා. අපි ඒ පිළිබඳවත් සලකා බලන්නම්. ඔබට ස්තූතියි." සියල්ලන්ගේම ඇස් කාල් දෙසට හැරී තිබුණි. කාල් මඳ සිනාවක් පා යළි අසුන්ගන්නා විට ඔහුගේ දෙනෙත් ආචාර්ය තෝමස්ගේ දෙනෙත් සමඟ ගැටුණි. තෝමස්ගේ දෙනෙත්වල උපහාසයත්, කෝපයත් මුසුවී තිබුණි.

විද්‍යාඥ හමුවේදී තමා වෙත එල්ලවූ අපහාසය සිතේ දරාගෙන කාල් පසුදින යළි සිය පර්යේෂණ ආරම්භ කළේය. එඩ්වඩ් ද සිය ආචාර්යවරයාට ගෞරවයක් ගෙන දීමේ අදිටනින් සිය උපරිමයෙන් කැපවීමට ඉටා ගත්තේය.

දින සති ගෙවී යන්නට විය. ඔවුන්ගේ පරීක්ෂණ එකින් එක අසාර්ථක විය. සිය පර්යේෂණ අභව්‍ය යැයි වූ චෝදනාව සත්‍ය වනු ඇත්දැයි කාල්ගේ සිතේම සැකයක් ඉපදී තිබුණි. කාල්ගේ සිත හොඳින් වටහාගෙන සිටි එඩ්වඩ් නිතර කාල් ධෛර්යවත් කරන්නට වූයේය. ඔවුහු සිය පරීක්ෂණ විවිධ පැතිකඩ ඔස්සේ මෙහෙයවන්නට වූහ.

2130.08.10 වන දින සාමාන්‍ය දිනයක් ලෙසට ගෙවී යන්නට විය. කාල් හා එඩ්වඩ් විද්‍යාගාරයේ සුපුරුදු පරිදි සිය පරීක්ෂණවල නිරත වී සිටියහ. එඩ්වඩ් කාල් විසින් පිළියළ කරන්නට යෙදුණු නිදර්ශකයක් පරීක්ෂාකරමින් සිටි අතර, කාල් සිය පරීක්ෂණ වාර්තා කියවීමෙහි නිමග්න වී සිටියේය.

"සර්! සර්!! මේ බලන්න" කාල්ගේ දෑහැන බිඳුණේ එඩ්වඩ්ගේ කලබලයට පත් හඬිනි. ර්ළඟ මොහොතේ ඔවුන් දෙදෙනාම දෑස් දල්වා බලා සිටියේ අන්වීක්ෂයට සම්බන්ධ කළ පරිගණක තිරය දෙසය. කාල්ගේ දෑස් සතුටු කඳුළින් තෙත්විය. "සර් ඒක කළා... සර් ඒක කළා..... " එඩ්වඩ්ගේ ප්‍රීතිමත් හඬින් විද්‍යාගාරය පිරී ගියේය. ඔහුගේ උත්සාහය මල්ඵල ගැන්වී තිබුණි. ඔවුන් බලාපොරොත්තු වූ ලක්ෂණ සහිත ශාක විශේෂය ඔවුන්ගේ දෑස් ඉදිරිපිට විය. කාල් හා එඩ්වඩ් සිය සාර්ථක පරීක්ෂණ වාර්තාව සකස්කරන්නට වූහ. මෙම සොයාගැනීම අඟහරු ලොව විප්ලවීය වෙනසක් ඇති කරන බව ඔවුන්ට ප්‍රත්‍යක්ෂ විය.

සියලු වාර්තා යළි යළිත් සියුම්ව විශ්ලේෂණය කෙරිණි. පර්යේෂණය සාර්ථක බව ප්‍රත්‍යක්ෂ විය. දෙසතියකට පසු මෙම සොයාගැනීම සියල්ලන් ඉදිරියේ අනාවරණය කරන මොහොත උදාවී තිබුණි. අඟහරු වැසියන්ට වටිනා අවස්ථාවක් වූ මෙම අවස්ථාව ආවරණය කිරීමට සියලුම මාධ්‍ය සූදානම්ව සිටියහ. ආචාර්ය කාල් මැකාති සිය විශ්වාසවන්ත සහායකයා වූ එඩ්වඩ් සමඟ සියලුම විද්‍යාඥ පිරිස හමුවේ සිය වාර්තාව ඉදිරිපත් කළේය. සභා ශාලාවෙන් මතුවූ අත්පොළසන් නාදය කාල්ගේ නෙතගට කඳුළක් ගෙනෙන්නට සමත්විය. අවසානයේ සියලුම අපහාස උපහාස මධ්‍යයේ ඔහු සිය සිහිනය සැබෑකරගෙන තිබූ අතර නොපසුබට උත්සාහයේ හා ධෛර්යයේ වටිනාකම සියල්ලන් ඉදිරියේ සනාථ කර පෙන්වීමට සමත්වී සිටියේය.

බී.පී. සයුරිකා පබසරණි 13-C (විද්‍යා අංශය)

**ඔබ දුප්පත්ව ඉපදීම ඔබේ වරදක් නොවේ. ඔබ දුප්පත්ව මියයනවා නම් එය ඔබේ වරදකි.**

# විශ්ව භාෂා



## 日本語の ことわざ

白ワイン に 赤ワイン を 入れる と ワイン は 赤く なります。人 も いい ともだち と なかよくすれば いい 人 に なります が 悪い ともだち と なかよく する と 悪い こと を します。ですから、悪い ともだち と なかよく しない ほうが いい と 言う いみ です。
私たち は いつも いい ともだち を えらば なければ なりません。

**සිංහල පරිවර්තනය**

## ජපන් ප්‍රස්තාව පිරුළු

සුදු වයින්වලට රතු වයින් දැමූ විට වයින් රතුපාට බවට පත්වේ. පුද්ගලයෝද හොඳ යාහළුවෙකු සමග මිත්‍රශීලී වුවහොත් හොඳ පුද්ගලයන් බවට පත් වුණත් නරක යහළුවෙකු සමඟ මිත්‍රශීලී වූ විට නරක දේවල් කරති. එම නිසා, නරක යාළුවෙකු සමඟ මිත්‍රශීලී නොවීම වඩාත් හොඳය යන අදහසක් වේ. අපි නිතරම හොඳ යාළුවන් තෝරාගත යුතුය.

දෙව්මිණී මන්දිරා
**13 - L**

## माँ का प्यार

उससे धनी न यह संसार,
पास है जिसके माँ का प्यार।
झूठ-मूठ गुस्साती वह,
झट प्रसन्न हो जाती वह।।

दुखी देख संतानों को,
हँसकर गले लगाती वह।
अपने सारे कष्ट भुलाकर,
करती खुशियों की बौछार।।

**සිංහල පරිවර්තනය**

## අම්මාගේ ආදරය

ඊට වඩා වස්තුවක් නැහැ මේ ලෝකයේ,
අම්මාගේ ආදරය ළඟ ඇති කෙනෙකුට
බොරුවට කේන්ති ගන්නා ඇය,
ක්ෂණිකව සතුටු වන්නීය

දුක් දැක දරුවන්ව,
සිනාසී වැළඳගනී ඇය
තම අපහසුතා අමතක කර,
සතුට වර්ෂාවක් ඇති කරයි

නෙත්මි සිසාරා
**13 - M**

# Challenges Make us Strong

The word challenge itself has an encouraging meaning. It means a new situation or an experience one has to confront or face without dodging or avoiding. In fact, challenges are a blessing in life. The thrill of life is to face challenges for a student. If a person understands and realizes what he is going to face is a challenge he has got to work upto It. Instead of facing it, if he or she tries to escape from that. It means, he or she becomes a failure. Those who braved the onslaughts of challenges are really winners.

The great men in history are those who have faced many daring challenges. To face these challenges successfully one should possess certain positive qualities like courage, endurance, determination and consistency. Once a person is confronted with challenges he or she is likely to develop these qualities. The more you face challenges, the more you hardened and thick skinned to overcome the challenges.

In the field of education an assignment, a task or a project is a challenge for a student. By facing these tasks successfully a student gains experience to overcome the challenges. The challenges a person overcomes at school, institute or university train the person to face the challenges in life at large. The life itself is a challenge. There are so many problems, hurdles or obstacles one finds in his way. Taking the responsibilities of a job, getting into marriage, social misunderstandings, opposition, rivalary arisins out of the society are all challenges for life. Without getting frustrated or crest fallen, if one tries to face these challenges wisely makes his or her life stronger.

Face the challenges, take up the challenge grapple with it, then you are sure to end up in a stronger position. Therefore at last I want to wind up this by saying challenges make us strong.

**S.A. Janani Sachinthani Senarath**
**13 - K**

# මවකගේ කඳුළු

"සුද්දි... නැගිටින්න මගෙ පුතේ, ඉස්කෝලෙ යන්න තියෙනවානෙ." මම හීයක වේගයෙන් නැගිට්ටෙමි. හැමදාමත් මෙහෙමයි. අම්මා මගේ ළඟින් කොයි වෙලේ නැගිට්ටවද කියල මම දන්නේ නැහැ. හැබැයි මම නැගිටින්න ඕන වෙලාව නම් අම්මා හොඳටම දන්නවා.

සුද්දි කිව්වට ඇත්තටම මගේ නම ජයනි අමාශාක්‍යා. ඒ නම මට තිබ්බෙ පන්සලේ ලොකු හාමුදුරුවොලු. තාත්ත නැති උණත් හරි අම්මා මාව ජීවත් කරවන්න ගොඩක් දුක් විඳිනවා.

මම හෙමින් හෙමින් කුස්සියට ගියා. ලිප් ගල උඩ දුම් දමමින් වතුර මුට්ටිය නටනවා. මම එනවා ඇහුණ අම්මා හනික තේ කහට වක්කරන්න පටන් ගත්තා. මං හැමදාමත් ඉඳගන්න බංකුව අම්මගෙ ළඟින් තියලා වාඩිවුණා.

අල්ලට ගත්ත සීනි ඇබින්ද එක්ක තේ බොන අතරේ අම්මා හාල් මිටක් අරගෙන ලිපේ තිබ්බෙ මාව හිස්බඩ ඉස්කෝලෙ යවන්න බැරි හින්ද. "පුතේ.... ඔයා හොඳට මහන්සි වෙලා ඉගෙන ගන්න ඕන. මගේ පුතා ගොඩක් දක්ෂයි කියලා ටීචර් කිව්වා. පුතාගේ තාත්තා කොහේ හරි ඉඳන් පුතාට ආශිර්වාද කරනවා ඇති." " මං ඒක දන්නවා අම්මේ.... මගේ අම්මගේ බලාපොරොත්තු මම කොහොමහරි ඉටුකරනවා." අම්මගෙ කම්මුල දිගේ කඳුළු කැට බේරෙන හැටි මම දැක්කා. දහසක් දුක්ඛ දෝමනස්සයන් ඒ කඳුළු දිගේ එළියට එනවා කියලා මට දැනුණා.

ඉස්කෝලේ යන්න මට සපත්තු තිබුණෙ නැහැ. එකම එක සුදු ගවුමක් විතරයි මට තිබුණේ. ඒත් මගේ අම්මා මාව ලස්සනට පිරිසුදුව ඉස්කෝලේ යැව්වා. සමහර ළමයි මාව පංතියෙන් කොන් කළා පොල් කඩන මිනිහගෙ කෙල්ල කියලා. මගේ තාත්තා මැරුණේ පොල් ගහෙන් වැටිලා කියන එක මට වේදනාවක් වුණා. මගෙ රත්තරං තාත්තා මාව ජීවත් කරවන්න ගිහින් ජීවිතෙන් සමුගත්තා.

"ජයනි, මොකද දරුවො?"

ගුරුතුමියගේ හඬින් මම පියවි ලෝකෙට ආවා. "මොකක්ද?, මොකක් හරි ප්‍රශ්නයක්ද?" ළමයි මට විහිළු කරනවා කියලා මම ගුරුතුමීට කීවේ නැහැ. "නැහැ නැහැ ටීචර්... මොකුත් නැහැ."

"ළමයි... මේ අහන්න, ජාත්‍යන්තර චිත්‍ර තරගයකට යවන්න අපේ කලාපයේ පාසල් කිහිපයකිනුත් චිත්‍ර කීපයක් ඉල්ලලා තියෙනවා. ඉතින් අපේ පාසලත් ඒ වෙනුවෙන් තෝරගෙන. ඔයාලා හැමෝම සිකුරාදට කොළයි, පාට පෙට්ටියකුයි ගේන්න ඕන." මගේ හිත කීරි ගැහුණා. මට චිත්‍ර අඳින්න නම් පුළුවන්. ඒත් කොළ ගන්න, පාට ගන්න මගෙ අම්ම ළඟ කොහෙන්ද සල්ලි. මේ ගැන අම්මට කියන්නත් බැහැ.

ගෙදර ගිය මම අම්මා කෝ කියලා බැලුවා. "අම්මේ... අම්මේ...." අම්මා ගෙදර නැහැ වගේ. මම වත්ත පහළට ගියා. මගේ අම්මා වත්ත පහළ පොල් අතු වියනවා. හනික ගෙදරට ගිය මම ඇඳුම් ගලවල සෝදලා දමලා අම්මට උදව් වෙන්න වත්ත පහළට ගියා. "මගේ පුතේ... මුට්ටියේ බත් ඇති ගිහින් කන්න." අම්මා මට එහෙම කිව්වට මම අම්මා නැතුව බත් කන්න යන්නේ නැහැ. මොකද මම ඒ බත් ටික කෑවොත් අම්මා මුළු දවසෙම බඩගින්නෙ ඉන්න බව මම දන්නවා.

"ඕන නෑ අම්මේ... මට බඩගිනි නැහැ අපි පස්සේ කමු." එහෙම කියපු මම අම්මත් එක්ක පොල් අතු වියන්න පටන් ගත්තා. මට චිත්‍ර තරගය මතක් වුණා. ඒත්... මට ඒ තරගෙට ඉන්න වෙන්නේ නැති බව මම හොඳටම දන්නවා. කඳුළු බිංදුවක් ඇහැට ආවත් මම ඒක අම්මට හොරෙන් හංගගත්තා.

සිකුරාදා දවස ආවා. ළමයි හැමෝම චිත්‍ර අඳින්න සූදානම්. ඒත්... මම...., "ජයනි කෝ කොළ." "ඔයා ඔයා චිත්‍ර අඳින්නේ නැද්ද?" ගුරුතුමී මං ළඟට ආවා. ඇස්වලින් ගලා හැලෙන කඳුළු ගුරුතුමීට උත්තර බැන්දා.

ඇගෙන් ලැබුණු කොළය සහ පාට පෙට්ටිය අරගෙන මම වාඩි වුණා. මට මගේ අම්මව මැවි මැවී පෙනුණා. දරමිටියක් ඔළුවේ තියාගෙන මාව ජීවත් කරවන්න මහන්සි වෙන මගෙ අම්මව මම චිත්‍රයට නැගුවා .

දින, සති, මාස, ගෙවී ගියා. එක් සඳුදාවක ප්‍රධාන රැස්වීමෙන් පස්සේ විදුහල්පතිතුමා චිත්‍ර තරගයෙන් තේරී පත්වුණ ළමයෙක් අපේ පාසලේ ඉන්න බව කීවේ ආඩම්බරයෙන්. එතකොටයි මට මතක් වුණේ මමත් චිත්‍රයක් ඇන්දනේ කියලා. ළමයි කසු කුසු ගාන්න පටන් ගත්තා. "මෙම ජාත්‍යන්තර චිත්‍ර තරගයෙන් අපේ පුංචි පාසලට කීර්තියක් ගෙන දෙන්න සමත් වෙලා තියෙන්නෙ 8 ශ්‍රේණියේ ජයනි අමාශාක්‍යා ශිෂ්‍යාවයි." මට හීනෙන් වගේ ඒ නම ඇහුණා. කන් බිහිරි කරවන අත්පොළසන් නාදයක් මැද මගේ ළඟින් හිටිය ළමයි මාව තල්ලුකරලා ඉස්සරහට ඇරියා.

"ජයනි දියණිය මේ චිත්‍ර තරගයෙන් පළමු ස්ථානය ලබාගෙන අපේ පාසලටත් අපේ රටටත් කීර්තියක් ලබා දී තියෙනවා. ජයනි චිත්‍රය නම් කරලා තිබුණේ "මවකගේ කඳුළු කියලා". ඇයි ජයනි ඔයා ඒ චිත්‍රයට එහෙම නමක් දැම්මේ?" "මම අලුත් දෙයක් අඳින්න ගියෙ නෑ සර්, මම හැමදාම දැක්කෙ මගේ අම්මා මං වෙනුවෙන් වෙන මහන්සිය විතරයි. ඒ දැකපු දේ මං චිත්‍රයට නැගුවා. එකට මම මවකගේ කඳුළු කියලා මාතෘකාව දැම්මා." මං දැක්කා විදුහල්පතිතුමාගේ ඇස්වල කඳුළු බිංදුවක් නළියනවා.

R.C.J. පතිරණ මිය
ප්‍රාථමික අංශය

## ගෘහවිද්‍යාගාරයෙන් රස පණිවිඩයක්...

### කොස් වාරයට කොස්වලින් පෝෂ්‍යදායී ආහාරයක්.

# කොස් කොත්තුව



**අවශ්‍ය ද්‍රව්‍ය :-**

තම්බාගත් කොස් - 250 g
කැරට් අලයක්
ලීක්ස් - 100g
බෝංචි කරල් 5ක් පමණ
බී-ළූණු ගෙඩියක්
සුදු ළූණු ගෙඩි 3ක් පමණ (තලා ගන්න)
අවශ්‍ය නම් බැදගත් වියලි මිරිස් කරල් කීපයක්
ඇස්ට්‍රා මේස හැඳි 1½ (පොල්තෙල් මේස හැඳි 2ක්)
ලුණු අවශ්‍ය පමණ
ගම්මිරිස් අවශ්‍ය පමණ
කරපිංචා ඉති 2ක්
කතුරුමුරුංගා ඉති 2,3ක්
අවශ්‍ය නම් ගැඹුරු තෙලේ බැදගත් මස් හෝ මාලු කැබලි

**සාදන ක්‍රමය :-**

- තම්බාගත් කොස් පොඩිකරගන්න.
- කැරට්, ලීක්ස්, බෝංචි, සුද්ධ කර සෝදා සිහින් තීරු කපා ගන්න.
- කතුරුමුරුංගා කොළ සෝදා සහින්ව ලියාගන්න.
- බී-ළූණු සිහින්ව ලියාගන්න.
- කරපිංචා සිහින්ව ලියාගන්න.
- ඇස්ට්‍රා මේස හැඳි 1½ බඳුනකට දමා රත්වෙන්න හරින්න.
- මෙයට තලාගත් සුදුළූණු එක්කර බැදෙන්න හරින්න.
- සුදුළූණු සුවඳ එන විට බී-ළූණු, කරපිංචා එක් කරන්න.
- එය බැදෙන විට එළවළු සියල්ල එක්කර හොඳින් තෙම්පරාදු කරගන්න.
- මෙයට තම්බාගත් කොස් එක් කර අවශ්‍ය ප්‍රමාණයට ලුණු, ගම්මිරිස් යොදා ගන්න.
- අවශ්‍ය නම් තෙලේ බැදගත් වියළි මිරිස් කරල් කැබලි කඩා එක් කළ හැකිය. එසේම මෙයට කුඩාවට කපා ගැඹුරු තෙලේ බැද ගත් මාලු කැබලි හෝ කුකුල් මස් කැබලිද එක් කර ගත හැක.

නදීරා ගුණසේන ගුරු මහත්මිය
ගෘහ විද්‍යා අංශය

# තෙමසක සැමරුම් අතරින්....




ධර්ම දේශනය හා වෙසක් සීල භාවනා වැඩසටහන




නෙළුම්මල් පූජාව




වෙසක් සැරසිලි




ප්‍රාථමික අංශයේ පැල සිටුවීමේ වැඩසටහන






විද්‍යා, කලා, වාණිජ අංශයන්ට සිසුන් ඇතුළත් කරගැනීම




විද්‍යා දිනය - 2019




නව නිපැයුම් ප්‍රදර්ශනය




Cooking Master වැඩමුළුව





ශිල්ප සුගන්ධාවලී - 2018



Deepana Printers - Gmpaha - 033 2226913